සැ. යු. - (i) 2020.07.03 වැනි දින පළ වූ අංක 2183 දරන ගැසට් පත්‍රයේ II කොටස පළ නොවීය.
(ii) මෙවර පළවන ගැසට් පත්‍රයේ VI කොටසේ 2020 වර්ෂය සඳහා පොළොන්නරුව දිස්ත්‍රික්කයට අයත් අධිකරණ කලාපවල ජූරි සභිකයින්ගේ නාමාවලියක් සිංහල, දෙමළ, භාෂාවන්ගෙන් පළ වේ.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,184- 2020 ජූලි මස 10 වැනි සිකුරාදා - 2020.07.10**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIආ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව |
|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් .... ... ... | 808 |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... | 811 |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... ... | 820 |
| රජයේ නොවන දැන්වීම් ... ... ... | 823 |
| රට බීම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් ... ... | 826 |
| වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් ... ... ... | 831 |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම ගැසට් පත්‍රය පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2020 ජූලි මස 31 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2020 ජූලි මස 17 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*" යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණකර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2020 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

**ශ්‍රී ලංකා දුම්රිය සේවය**

ප්‍රසම්පාදන දැන්වීමයි

**එම් 2 පංතියේ දුම්රිය එන්ජින් සඳහා ඇල්කලින් බැටරි කට්ටල 05ක් මිලදී ගැනීම සඳහා ප්‍රසම්පාදනය**

ප්‍රසම්පාදන අංකය :: SRS/F. 7660

ශ්‍රී ලංකා දුම්රිය සේවයේ, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන (ප්‍රධාන) කමිටුවේ සභාපති විසින් ශ්‍රී ලංකා දුම්රිය සේවයට එම් 2 පංතියේ දුම්රිය එන්ජින් සඳහා ඇල්කලින් බැටරි කට්ටල 05ක් මිලදී ගැනීම : (Purchase of 05 sets of Alkaline Batteries for M2 Class Locomotives) සඳහා නිෂ්පාදකයින්ගෙන්/සැපයුම්කරුවන්ගෙන් මුද්‍රා, තැබූ ලංසු කැඳවනු ලැබේ. නිෂ්පාදකයින්ට තම ලංසු සෘජුව හෝ ඇටෝර්නි බලපත්‍රයකින් බලය පැවරූ පත්කළ නියෝජිතයකු මගින් ඉදිරිපත් කළ හැකි ය.

02. ලංසු භාර ගැනීම 2020.07.16 දින (ශ්‍රී ලංකා වේලාවෙන්) ප. ව. 2.00 ට අවසන් කෙරේ.

03. ආපසු නොගෙවන රු. 5,750 ක හෝ පහසුවෙන් මාරුකරගත හැකි මුදල් වර්ගයකින් සමාන වටිනාකමැති ලිපිලේඛන ගාස්තුවක් ගෙවීමෙන් 2020.07.15 දින (ශ්‍රී ලංකා වේලාවෙන්) ප. ව. 3.00 තෙක් ශ්‍රී ලංකාව, කොළඹ 10, ඕල්කොට් මාවත, දුම්රිය ගබඩා අධිකාරී කාර්යාලයෙන් හෝ විදේශ දූත කාර්යාලවලින් ලංසුකරණ ලිපිලේඛන, සමග ලබාගත හැකි ආකෘති පත්‍ර මගින් ලංසු ඉදිරිපත් කළ යුතු ය.

04. ලංසු භාර ගැනීම අවසන් වූ වහාම ශ්‍රී ලංකාව, කොළඹ 10, ඕල්කොට් මාවත, දුම්රිය ගබඩා අධිකාරී කාර්යාලයේදී ලංසු විවෘත කෙරේ. ලංසුකරුවන්ට හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයින්ට ලංසු විවෘත කිරීමේ අවස්ථාවට සහභාගි වන ලෙස ඉල්ලා සිටිනු ලැබේ.

05. මුද්‍රා, තැබූ ලංසු පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ අතින් ගෙනැවිත් භාරදීම හෝ කළ යුතු ය.

සභාපති,<br>
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන (ප්‍රධාන) කමිටුව,<br>
දුම්රිය ගබඩා අධිකාරී කාර්යාලය,<br>
ශ්‍රී ලංකා දුම්රිය සේවය,<br>
ඕල්කොට් මාවත, කොළඹ 10.

06. ශ්‍රී ලංකාව, කොළඹ 10, ඕල්කොට් මාවත, දුම්රිය ගබඩා අධිකාරී කාර්යාලයේ දී ගාස්තු ගෙවීමකින් තොරව ලංසුකරණ ලිපිලේඛන පරීක්ෂාකර බැලිය හැකි ය.

07. වැඩිමනත් විස්තර සඳහා අමතන්න.

දුම්රිය ගබඩා අධිකාරී,<br>
දුම්රිය ගබඩා අධිකාරී කාර්යාලය,<br>
තැ. පෙ. 1347, ඕල්කොට් මාවත, කොළඹ 10.<br>
දුරකථන අංක : 94(11) 2438078 හෝ 94 (11)2436818<br>
ෆැක්ස් : 94(11)2432044<br>
විද්‍යුත් තැපැල : srs.slr@gmail.com<br>
වෙබ් අඩවිය :www.railway.gov.lk

සභාපති,<br>
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන (ප්‍රධාන) කමිටුව,<br>
ශ්‍රී ලංකා දුම්රිය සේවය.

යොමු අංකය : SRS/F. 7660

07-303

---

**ශ්‍රී ලංකා දුම්රිය සේවය**

ලංසු සඳහා ආරාධනයයි (IFB)

**ශ්‍රී ලංකා දුම්රිය සේවය සඳහා, EN 45 E1 R 260 - EN 13674 (45' 00") රේල්පීලි 8,000ක් ප්‍රසම්පාදනය**

ලංසු ආරාධනා අංක :: SRS/F. 7713

ශ්‍රී ලංකාවේ, කොළඹ, තැ. පෙ. 355, දුම්රිය මූලස්ථානයේ ශ්‍රී ලංකා දුම්රිය සේවය වෙනුවෙන්, අමාත්‍ය මණ්ඩලය පත් කළ ස්ථාවර ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින්, සුදුසුකම්ලත් හා නිපුණතාපූර්ණ ලංසුකරුවන් වෙතින් ශ්‍රී ලංකා දුම්රිය සේවය සඳහා EN 45 E1 (45' 00") (13.716m), R 260 - EN 13674 රේල්පීලි 8,000ක් සැපයීම සඳහා මුද්‍රා තැබූ ලංසු කැඳවනු ලැබේ. ලංසුකරුවන්ට, තම ලංසු, ඇටර්නි බලපත්‍රයක් මගින් බලය පැවරූ පත්කළ නියෝජිතයකු මාර්ගයෙන් ඉදිරිපත් කළ හැකි ය.

02. ජාතික තරගකාරී ලංසුකරණ ක්‍රියාපටිපාටිය තුළින් මෙම ලංසුකරණය පවත්වනු ලැබේ.

03. උනන්දුවක් දක්වන සුදුසුකම්ලත් ලංසුකරුවන්හට අවශ්‍ය වැඩිදුර විස්තර ලබාගැනීමත්, ලංසු ලේඛන පරීක්ෂාකොට බැලීමත්, පහත සඳහන් ලිපිනයේ දී පෙරවරු 9.00 හා පස්වරු 3.00 අතර කාලය තුළ කළ හැකි ය.

දුම්රිය ගබඩා අධිකාරී,<br>
දුම්රිය ගබඩා දෙපාර්තමේන්තුව,<br>
ඕල්කොට් මාවත, කොළඹ 10, ශ්‍රී ලංකාව.<br>
දුරකථන අංක : 94(11)2438078 හේ 93 (11) 2436818<br>
ෆැක්ස් අංක : 94 (11)2432044<br>
ඊමේල් : srs.slr@gmail.com<br>
වෙබ් අඩවිය : www.railway.gov.lk

04. අවශ්‍ය සුදුසුකම් අතරට මේවා ද ඇතුළත් ය.

(අ) මෙම කොන්ත්‍රාත්තුව යටතේ සැපයීමට අපේක්ෂිත භාණ්ඩ, ලංසු ලේඛන සමග නිකුත් කරනු ලබන දුම්රිය ගබඩා පිරිවිතර RSS 557 A සමග අනුකූල විය යුතු ය.

(ආ) සපයනු ලබන මෙම එක් එක් අයිතමයක් සඳහා, නිර්මාණ හා නිෂ්පාදනය සඳහා ISO 9001 : 2008 සහතිකයේ පිටපත් ලංසුව සමග ඉදිරිපත් කළ යුතු ය.

(ඇ) සුදුසුකම්ලත් ලංසුකරුවන් ඃ

(i) සියලුම ලංසුකරුවන් වෙත, මෙම කොන්ත්‍රාත්තුව යටතේ අදාළ භාණ්ඩ සැපයීම සඳහා නෛතික හිමිකම් සතුවිය යුතු ය.

(ii) ලංසුකරුවකුහට ළැදියාවන්ගේ පිළිගැටුම් නොතිබිය යුතු ය. එවන් ළැදියාවන්ගේ පිළිගැටුම් (Conflict of Interest) සහිත බව දනගතහොත් ඔවුන් සුදුසුකමින් ඉවත් කරනු ඇත. මෙම ලංසුකරණය තුළ, පාර්ශ්ව එකක් හෝ කිහිපයක් සමග එවන් පිළිගැටුම් පවත්වනු ලබන ලංසුකරුවන් පහත සඳහන් කරුණු මත සලකා බැලීමට හැකියාව ඇත.

(අ) පසුගිය කාලය තුළ, මෙම ලංසුකරණය යටතේ මිල දී ගනු ලබන භාණ්ඩ ප්‍රසම්පාදනය සඳහා භාවිතා කරනු ලබන නිර්මාණ, පිරිවිතර හා අනෙකුත් ලේඛන සකස් කිරීමේ උපදේශක සේවාවන් ගැනුම්කරු වෙත ලබා දීමට කටයුතු කිරීමේ කාර්යයෙහි නියුතුව සිටි ආයතනයක් හෝ ආශ්‍රිත ආයතනයක් සමග සහයෝගයෙන් කටයුතු කළ හෝ,

(ආ) මෙම ලංසුකරණය සඳහා එකකට වඩා ලංසු ඉදිරිපත් කොට තිබීම, කෙසේ වෙතත් එක් ලංසුවකට වඩා උප කොන්ත්‍රාත්කරුවන්හට සහභාගිවීම මෙයින් සිදු නොකෙරේ.

(iii) ජාතික ප්‍රසම්පාදන නියෝජිතායතනය (NPA) විසින්, ලංසු භාර දෙනු ලබන හෝ කොන්ත්‍රාත් ප්‍රදන දින වන විට නුසුදුස්සෙකු බවට, ප්‍රකාශිත ලංසුකරුවන් මේ සඳහා සුදුසුකම් නොලබති. ඉවත් කොට ඇති ආයතනවල නම් ලැයිස්තුවක් NPA වෙබ් අඩවිය වන www.npa.gov.lk හි පළකොට ඇත.

(iv) පසුගිය වසර දහය (10) තුළ ජාත්‍යන්තර තරගකාරී ලංසුකරණ පදනමින්, අවම වශයෙන්, EN 45 E1/ BS90(A) රේල් පීලි 5,000 ක තොග ප්‍රමාණයක් (ටොන් 300) සැපයීම, සම්බන්ධයෙන් භාවිතා කළ සංවිධානයක් විසින් නිකුත් කළ කාර්යසාධන සහතිකයක් නිෂ්පාදකයන් සතුව තිබිය යුතු ය.

(v) නිෂ්පාදකයා/නිෂ්පාදකයන් විසින්, පසුගිය වසර දහය (10) තුළ EN 45 E1/BS90(A) රේල්පීලි අවම වශයෙන් 5,000ක් (ටොන් 300) ප්‍රමාණයක් හා පසුගිය වසර තුන (03) තුළ අනෙකුත් Vail Profile ටොන් 50,000 සැපයූ බවට තම රටේ රජය විසින් නිකුත් කළ EN 13674 ප්‍රමිතීන්ට අදාළ සහතිකයක් ඉදිරිපත් කළ යුතු ය.

05. (අ) යම් පුද්ගලයකු, ලංසුකරු සඳහා හෝ වෙනුවෙන් හෝ ඒජන්තවරයකු, උප ඒජන්තවරයකු නියෝජිතයකු හෝ නම් කළ අයකු ලෙස කටයුතු කිරීමට අපේක්ෂා කරනුයේ නම්, 1987 අංක 03 දරන පොදු කොන්ත්‍රාත් පනතේ අවශ්‍යතාව පරිදි, ශ්‍රී ලංකාවේ පොදු කොන්ත්‍රාත් රෙජිස්ට්‍රාර්වරයා වෙත ලංසු භාරදීමට පෙර ලියාපදිංචි වී සිටිය යුතු ය. එම සහතිකයේ මුල් පිටපත, ලංසුව සමග ඉදිරිපත් කළ යුතු ය. එම මුල් පිටපත ඉදිරිපත් කිරීමට අපොහොසත් වන ලංසුකරුවන් ප්‍රතික්ෂේප කෙරේ.

(ආ) ලංසුකරුවන් විසින්, 1987 අංක 03 දරන පොදු කොන්ත්‍රාත් පනත ප්‍රකාරව ලංසු භාරදුන් වහාම හා ප්‍රසම්පාදන ප්‍රදනයට පෙර ද ලියාපදිංචි වී සිටිය යුතු ය. ඒ අනුව පොදු කොන්ත්‍රාත් පනත ප්‍රකාරව එවන් ලියාපදිංචි සහතිකය අදාළ ප්‍රසම්පාදන කමිටුවට ඉදිරිපත් කිරීමට යම් ලංසුකරුවකු අපොහොසත් වන්නේ නම් ඔහු හට ප්‍රසම්පාදනය නොකෙරේ.

06. ආපසු ගෙවනු නොලබන ගාස්තු රුපියල් 75,000 හෝ පහසුවෙන් හුවමාරු කළ හැකි මුදල් වර්ගයකින් ගෙවීමෙන් හා ශ්‍රී ලංකාවේ , කොළඹ 10, ඕල්කොට් මාවතේ, දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලය හෝ විදේශයන්හි ශ්‍රී ලංකා තානාපති කාර්යාල වෙත ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන්, 2020.06.26 දින සිට 2020.08.07 දින පස්වරු 3.00 (ශ්‍රී ලංකා වේලාවෙන්) දක්වා කාලය තුළ උනන්දුවක් දක්වන ලංසුකරුවන්හට, ඉංග්‍රීසි භාෂාවෙන් සකස් කළ සම්පූර්ණ ලංසුලේඛන කට්ටලයක් මිලදී ගත හැක.

07. ලංසු 2020.08.10 දින පස්වරු 2.00 ට පෙර පහත සඳහන් ලිපිනයට ලැබීමට සැලැස්විය යුතු ය.

සභාපති,
අමාත්‍ය මණ්ඩලය පත්කළ ස්ථාවර ප්‍රසම්පාදන කමිටුව,
ප්‍රවාහන සේවා කළමනාකරණ අමාත්‍යාංශය,
07 වන මහල, සෙත්සිරිපාය, අදියර II, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.

ප්‍රමාද ලංසු ප්‍රතික්ෂේප කෙරේ. ලැබී ඇති ලංසු 2020.08.10 දින පස්වරු 2.00 ට ශ්‍රී ලංකාවේ, බත්තරමුල්ල, අදියර II සෙත්සිරිපාය, 07 වන මහල, ප්‍රවාහන සේවා කළමනාකරණ අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ මණ්ඩල කාමරයේ දී ලංසුකරුවන්ගේ නියෝජිතයන්ගේ ඉදිරියේ විවෘත කරනු ලැබේ.

සභාපති,
අමාත්‍ය මණ්ඩලය පත්කළ ස්ථාවර ප්‍රසම්පාදන කමිටුව,
ප්‍රවාහන සේවා කළමනාකරණ අමාත්‍යාංශය,
07 වන මහල, සෙත්සිරිපාය, අදියර II, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.

සභාපති,
අමාත්‍ය මණ්ඩලය පත්කළ ස්ථාවර ප්‍රසම්පාදන කමිටුව,
ප්‍රවාහන සේවා කළමනාකරණ අමාත්‍යාංශය.

යොමු අංකය : SRS/F. 7713

07-350

## ශ්‍රී ලංකා දුම්රිය සේවය

ලංසු සඳහා ආරාධනයයි

**පාවිච්චියට ගත නොහැකි බෙයාරිං ප්ලේට් තහඩු සහ වෙනත් ස්ථිර මාර්ග සුන්බුන් අයිතම බැහැරලීම**

ප්‍රසම්පාදන අංකය : SRS/F. 7596

ශ්‍රී ලංකා දුම්රිය සේවයේ, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ (ප්‍රධාන) හි සභාපති විසින් පහත සඳහන් මධ්‍යම, පහළ, උතුරු නැගෙනහිර සහ ඉහළ දිස්ත්‍රික්කවල IPW කොටස් හි ඇති (ආසන්න වශයෙන්) ටොන් 3113.08ක් වන පාවිච්චියට ගත නොහැකි බෙයාරිං ප්ලේට් සහ ෆිෂ් ප්ලේට් ඇණ හා මුරිච්චි, ඩොග් ස්පයික්ස්, රේලි පීලි කොටස් සහ වෙනත් ස්ථිර මාර්ග සුන්බුන් අයිතම බැහැරලීම සඳහා මුද්‍රා තබන ලද ලංසු භාරගනු ලැබේ. මෙම ලංසු එක් එක් දිස්ත්‍රික්කය සඳහා වෙන වෙන ම ඇගයීමට ලක් කරනු ඇති අතර, වෙන වෙනම ප්‍රදානය කිරීම ද සිදු කරනු ලැබේ. විස්තර තොරතුරු පහත සඳහන් පරිදි වේ :-

| *දිස්ත්‍රික්කය* | *IPWW කොට්ඨාසය* | *බැහැරලනු ලබන ප්‍රමාණය (ආසන්න වශයෙන්)* |
|---|---|---|
| මධ්‍යම දිස්ත්‍රික්කය | මුන්ඩෙල්, මාදම්පේ, මීගමුව, වේයන්ගොඩ, රාගම, දෙමටගොඩ, කොළඹ, අඹේපුස්ස, පොල්ගහවෙල, කුරුණෑගල, කඩුගන්නාව, ගනේවත්ත. | ටොන් 843.85 |
| පහළ දිස්ත්‍රික්කය | පන්නිපිටිය, කොටුව, මොරටුව, වාද්දුව, අලුත්ගම, ගාල්ල, වැලිගම | ටොන් 417.60 |
| උතුරු දිස්ත්‍රික්කය | ගල්ගමුව, අනුරාධපුර, මැදවච්චිය, වවුනියාව, යාපනය | ටොන් 994.98 |
| නැගෙනහිර දිස්ත්‍රික්කය | මොරගොල්ලාගම, කැකිරාව, ගල්ඔය, තඹලගමුව, පොළොන්නරුව, මනම්පිටිය, මඩකලපුව | ටොන් 737.42 |
| ඉහළ දිස්ත්‍රික්කය | මහනුවර, ගම්පොළ, හැටන්, නානුඔය, පට්ටිපොල, ඔහිය, බණ්ඩාරවෙල | ටොන් 119.23 |
| | මුළු ගණන (එකතුව) | ටොන් 3113.08 |

02. ලංසු භාර ගැනීම 2020.07.10 වැනි දින ප.ව. 2.00ට අවසන් වනු ඇත.

03. ලංසු ආපසු ගෙවනු නොලබන රු. 12,500.00 (රුපියල් දොළොස් දහස් පන්සියයක් පමණක්) වන ආපසු ගෙවනු නොලබන ලිපි ලේඛන ගාස්තුවක් ගෙවීමෙන් අනතුරුව 2020.07.09 වැනි දින ප.ව. 3.00 දක්වා දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලයෙන් ලබාගත හැකි ආකෘති පත්‍ර මත ඉදිරිපත් කළ යුතු ය.

04. සියලුම ලංසු සමග, ලංසු ලිපිලේඛනවල සඳහන් වටිනාකමට වන ලංසු සුරක්ෂණයක් ඉදිරිපත් කළ යුතු ය.

05. ලංසු, එම ලංසු භාරගන්නා අවසාන වේලාව ඉක්ම වූ වහාම දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලයේ දී විවෘත කරනු ලැබේ. ලංසු විවෘත කරනු ලබන අවස්ථාවට ලංසුකරුවන්ට හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයින් හට පැමිණ සිටින ලෙස ආරාධනය කරනු ලැබේ.

06. මුද්‍රා තබන ලද ලංසු පහත සඳහන් ලිපිනයට ලේඛනගත තැපෑලෙන් එවීම හෝ අතින් ගෙනැවිත් භාරදීම සිදු කළ යුතු ය.

සභාපති, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (ප්‍රධාන),
දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලය,
ශ්‍රී ලංකා දුම්රිය සේවය, ඕල්කට් මාවත, කොළඹ 10.

07. ලංසු ලිපිලේඛන දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලයේ දී නොමිලේ පරීක්ෂා කර බැලිය හැකි ය.

08. වැඩිදුර විස්තර සඳහා කරුණාකර කොළඹ 10, ඕල්කට් මාවතේ, දුම්රිය ගබඩා දෙපාර්තමේන්තුවේ දුම්රිය ගබඩා අධිකාරි වෙතින් විමසන්න.

දුරකථන : 011- 2438078/2436818
ෆැක්ස් : 011- 2432044

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව(ප්‍රධාන),
ශ්‍රී ලංකා දුම්රිය සේවය.

යොමු අංකය : SRS/F. 7596

07-304

---

# බඩු බාහිරාදිය විකිණීම්

**මනම්පිටිය සංචාරක මහෙස්ත්‍රාත් අධිකරණයේ වැලි ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම**

01. මනම්පිටිය සංචාරක මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩුවලට අදාළව රාජසන්තක කරන ලද වැලි කියුබ් 20ක් 2020.07.24 වැනි දින පෙ. ව. 9.00 ට මෙම අධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ දී විකුණනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

02. වෙන්දේසියේ මිළ දී ගනු ලබන වැලි සඳහා මුදල් ගෙවීමේ දී ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් පමණක් ගෙවීම් සිදුකළ යුතු අතර චෙක්පත් බැංකු අණකර කිසිවක් භාර ගනු නොලැබේ.

03. භාණ්ඩ මිළ දී ගැනීමේ දී තම අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා තම ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කළ යුතු ය.

04. වෙන්දේසියෙන් මිළ දී ගන්නා ලද වැලි වෙන්දේසිය පවත්වන දිනයේ දී ප. ව. 5.00 ට පෙර අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු ය.

05. වෙන්දේසිය සම්බන්ධයෙන් පැමිණිලි කිසිවක් තිබේ නම් වෙන්දේසිය පවත්වන අවස්ථාවේ දී ඉදිරිපත් කළ යුතු අතර, වෙන්දේසියෙන් පසුව ලැබෙන පැමිණිලි කිසිවක් භාරගනු නොලැබේ.

හර්ෂණ ධනුෂ්ක රත්නායක,
දිසා විනිසුරු/මහෙස්ත්‍රාත්,
දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය,
පොළොන්නරුව.

2020 ජූලි මස 23 වැනි දින,
පොළොන්නරුව දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

| *අනු. අංකය* | *අධිකරණය* | *වැලි කියුබ් ප්‍රමාණය* |
|---|---|---|
| 01. | මනම්පිටිය සංචාරක මහෙස්ත්‍රාත් අධිකරණ භූමියේ | 20 |

07-313

මගේ අංකය : ති. ම. අධි./න. භා./වෙන්දේසි 2020

## දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය - තිස්සමහාරාමය

තිස්සමහාරාම දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩුවලට අදාළ රාජසන්තක කරන ලද හා මෙතෙක් හිමිකම් නොකියන ලද වෙන්දේසි කිරීමට නියම කරන ලද මෙහි පහත උපලේඛනයේ සඳහන් ද්‍රව්‍යයන් 2020.07.26 වැනි දින පෙ. ව. 10.30 ට අධිකරණ භූමියේ දී වෙන්දේසියේ විකණනු ලැබේ.

02. මෙහි පහත උපලේනයේ සඳහන් කිසියම් භාණ්ඩයක් පිළිබඳව හිමිකම් දක්වන්නෙකු වේනම් වෙන්දේසිය පැවැත්වීමට නියමිත දින වෙන්දේසිය ආරම්භ කිරීමට පෙර ස්වකීය හිමිකම් ඉදිරිපත් කළ යුතු ය.

03. වෙන්දේසිය ආරම්භ කිරීමට පෙර රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය ලබා වෙන්දේසියේ විකිණීමට නියමිත ද්‍රව්‍යයන් පරීක්ෂා කර බැලිය හැකි ය. එය එදින පෙ. ව. 10.00 සිට පෙරවරු 10.30 දක්වා පමණි.

04. අධිකරණය විසින් නියම කරනු ලද අවම ලංසුව නොපිළිගන්නා අවස්ථාවේ දී අධිකරණයේ අභිමතය පරිදි එම ද්‍රව්‍යයන් වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ අයිතිය අධිකරණය සතුව පවතී.

05. වෙන්දේසියේ දී මිල දී ගන්නා ලද ද්‍රව්‍යයන් සඳහා එම අවස්ථාවේ දී ම මුදල් ගෙවිය යුතු අතර, එවලේ ම අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු ය. සියලුම ගෙවීම් මුදලින් කළ යුතු අතර, චෙක්පත් මුදල් ඇණවුම් ආදිය කිසිසේත් භාරගනු නොලැබේ.

06. වෙන්දේසියේ දී භාණ්ඩ මිලදී ගන්නන් විසින් තමන්ගේ අනන්‍යතාවය ජාතික හැඳුනුම්පත හෝ ඒ හා සමාන පිළිගත හැකි ලියවිල්ලකින් තහවුරු කළ යුතු ය.

කාංචනා පෙරේරා
දිසා විනිසුරු/මහෙස්ත්‍රාත්,
දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය,
තිස්සමහාරාමය.

2020 ජුනි මස 22 වැනි දින,
තිස්සමහාරාමය,
දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

### උපලේඛනය

| *අනු. අංකය* | *නඩු අංකය* | *භාණ්ඩ විස්තරය* | *ප්‍රමාණය* |
|---|---|---|---|
| 01. | 65785 | ලි. ප. අංක රහිත යතුරු පැදිය (අමතර කොටස්) | 01 |
| 02. | A.R. 624//19 | WP MQ 0429 යතුරු පැදිය | 01 |
| 03. | A.R. 623/19 | ලි. ප. අංක රහිත යතුරු පැදිය (අමතර කොටස්) | 01 |
| 04. | A.R.622/19 | UP BEK 6139 යතුරු පැදිය | 01 |
| 05. | A.R.1082/19 | UP TR 1092 යතුරු පැදිය | 01 |
| 06. | 47665 | SPBFM 1025 යතුරු පැදිය | 01 |
| 07. | K 54/15 | SP BBL 3506 යතුරු පැදිය (අමතර කොටස්) | 01 |
| 08. | A.R.1386/19 | ලි. ප. අංක රහිත යතුර පැදිය (අමතර කොටස්) | 01 |
| 09. | A.R.1386/19 | ලි. ප. අංක රහිත යතුරු පැදිය (අමතර කොටස්) | 01 |
| 10. | A.R.1386/19 | MG 0675 යතුරු පැදිය (අමතර කොටස්) | 01 |
| 11. | A.R.1388/19 | SP JX 8322 යතුරු පැදිය (අමතර කොටස්) | 01 |
| 12. | A.R.1311/19 | ලි. ප. අංක රහිත යතුරු පැදිය (අමතර කොටස්) | 01 |
| 13. | A.R.1235/16 | WP HD 6120 යතුරු පැදිය | 01 |
| 14. | A.R.1237/16 | UP MY 1964 යතුරු පැදිය | 01 |
| 15. | A.R.1628/19 | SP MN 5475 යතුරු පැදිය (අමතර කොටස්) | 01 |
| 16. | A.R.1629/19 | WP JD 7578 යතුරු පැදිය (අමතර කොටස්) | 01 |
| 17. | 46722 | UP HB 5646 අත් ට්‍රැක්ටරය හා ටේලර (අමතර කොටස්) | 01 |
| 18. | 39068 | ලි. ප. අංක රහිත අත් ට්‍රැක්ටරය හා ටේලරය (අමතර කොටස්) | 01 |
| 19. | 24380 | ලි. ප. අංක රහිත අත්ට්‍රැක්ටරය (අමතර කොටස්) | 01 |
| 20. | 51508 | ලි. ප. අංක රහිත අත් ට්‍රැක්ටරය හා ටේලරය (අමතර කොටස්) | 01 |
| 21. | 36599 | ලි. ප. අංක රහිත අත්ට්‍රැක්ටරය හා ටේලරය (අමතර කොටස්) | 01 |
| 22. | B.R.52749/198 | අබලන් පා පැදි | 01 |
| 23. | B.R.52749/18 | අබලන් පා පැදි | 01 |
| 24. | B.R.52749/18 | අබලන් පා පැදි | 01 |
| 25. | B.R.52749/18 | අබලන් පා පැදි | 01 |
| 26. | A.R.363/16 | අබලන් පා පැදි | 01 |
| 27. | B.R.31280/15 | අබලන් පා පැදි | 01 |
| 28. | B.R.26402/14 | අබලන් පා පැදි | 01 |
| 29. | A.R.6109/19 | පා පැදි | 01 |
| | | ජංගම දුරකථන චාජර් | 01 |
| 30. | 20104 | විදුලි පංකා | 01 |
| | | රයිස් කුකර් | 01 |
| | | විදුලි අයන් | 01 |
| 31. | 30272 | උදළු | 01 |
| 32. | 39454 | උදළු | 01 |
| 33. | 30414 | උදළු | 01 |
| 34. | 18415 | උදළු | 01 |
| | | තාච්චි | 01 |
| 35. | 30299 | උදළු | 01 |
| | | තාච්චි | 01 |
| 36. | 30377 | අලවංගු | 01 |
| | | තාච්චි | 02 |

| අනු. අංකය | නඩු අංකය | භාණ්ඩ විස්තරය | ප්‍රමාණය |
|---|---|---|---|
| | | උදළු | 01 |
| 37. | 43484 | කැති | 01 |
| 38. | 30455 | පොරෝ | 01 |
| 39. | 30486 | ඉල්ලංකුරු | 02 |
| | | ඉල්ලං කුඩ | 02 |
| | | ප්ලාස්ටික් ගැලුම් | 01 |
| 40. | 37275 | කැති | 01 |
| 41. | 34291 | කැති | 01 |
| 42. | A. R.376/12 | නොකියා ජංගම දුරකථන | 01 |
| 43. | A. R.563/12 | Taxcel - F7 ජංගම දුරකථන | 01 |
| 44. | 54819 | විදුලි උපාංග සහිත වයර් | 01 |
| 45. | 37215 | සවල් | 02 |
| 46. | අංක රහිත | ප්ලාස්ටික් බූලි (ලොකු) | 70 |
| 47. | අංක රහිත | ප්ලාස්ටික් බූලි (පොඩි) | 25 |
| 48. | අංක රහිත | වීදුරු බෝතල් තොගයක් | |
| 49. | මුහුදු වැලි | කියුබ් | 03 |
| 50. | පස් | කියුබ් | 12 |

07-369

---

**දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය - අම්පාර**

**අධිකරණය වෙත ඉදිරිපත් කරනු ලැබූ රාජසන්තක වී ඇති වාහන භාණ්ඩ සහ වැලි/පස් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම**

අම්පාර මහෙස්ත්‍රාත් අධිකරණයේ අවසන් වී ඇති රාජසන්තක කරන ලද වැලි කියුබ් 48.35 ක ප්‍රමාණය 2020.07.25 දින පෙ. ව. 9.00 ට ඉඟිණියාගල, කළුගොල්ල, පහලලන්ද තලාබණ්ඩාරලාගේ පාලිත රම්‍යසිරි යන අයගේ වැලි ගබඩා පරිශ්‍රයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන බවත් මෙම අධිකරණයේ අවසන් වී ඇති නඩුවලට අදාළ රාජසන්තක කරන ලද මෙතෙක් හිමිකම් නොපාන ලද පහත ලේඛනයේ සඳහන් වාහන හා භාණ්ඩ 2020.07.25 වැනි දින පෙ. ව. 10.30 ට අම්පාර දිසා/මහෙස්ත්‍රාත් අධිකරණ භූමියේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

02. මෙහි ලේඛනයේ සඳහන් කිසියම් භාණ්ඩයක් සම්බන්ධයෙන් හිමිකම් කියන අයෙකු වෙතොත් වෙන්දේසිය ආරම්භ කිරීමට ප්‍රථම තම හිමිකම අධිකරණ රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

03. රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය මත එදින පෙ. ව. 9.30 සිට පෙ. ව. 10.15 දක්වා කාලය තුළ භාණ්ඩ පරීක්ෂා කිරීමට ඉඩදෙනු ලැබේ. අධිකරණය විසින් නියම කරනු ලබන අවම ලංසුව නොපිළිගැනෙන අවස්ථාවලදී අධිකරණ අභිමතය පරිදි එම භාණ්ඩයන් වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ අයිතිය අධිකරණය සතුව පවතී. වෙන්දේසියේ දී මිලදී ගනු ලබන භාණ්ඩයන් සඳහා එවලේ ම මුදල් ගෙවිය යුතු අතර චෙක්පත් මුදල් ඇණවුම් භාරගනු නොලැබේ.

04. වෙන්දේසියේ දී මිලදී ගනු ලබන භාණ්ඩයන් එදිනම අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු ය. වෙන්දේසිය සම්බන්ධයෙන් පැමිණිලි කිසිවක් තිබේ නම් වෙන්දේසිය පවතින අවස්ථාවේ දී ඉදිරිපත් කළ යුතු අතර වෙන්දේසියෙන් පසුව ලැබෙන පැමිණිලි කිසිවක් භාරගනු නොලැබේ. වෙන්දේසියේ භාණ්ඩ ඉල්ලුම් කිරීමට පැමිණෙන්නන් තම ජාතික හැඳුනුම් පත ඉදිරිපත්කළ යුතු ය.

ඒ. අයි. හෙට්ටිවත්ත,<br>
දිසා විනිසුරු සහ මහෙස්ත්‍රාත්,<br>
දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය,<br>
අම්පාර.

2020 ජුනි මස 24 වැනි දින,<br>
අම්පාර දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

**ප්‍රසිද්ධ වෙන්දේසි ලේඛනය**

| අනු. අංකය | නඩු අංකය | භාණ්ඩ පිළිබඳ විස්තරය |
|---|---|---|
| 01. | 68728 | අංක 68-0218 දරන ISUZU වර්ගයේ ලොරි රථය |
| 02. | 70711 | අංක 47-3270 දරන TATA වර්ගයේ ලොරි රථය (අමතර කොටස් සඳහා පමණි) |
| 03. | 82200 | අංක UPRE 6522 දරන MAHINDRA වර්ගයේ ට්‍රැක්ටර් මැෂිම හා තැටි නගුල |
| 04. | 80208 | අංක UPJR 7153 දරන ASHOK LEYLAND වර්ගයේ ලොරි රථය (අමතර කොටස් සඳහා පමණි) |
| 05. | 95097 | අංක EPSM 4204 දරන SUNTEC වර්ගයේ අත් ට්‍රැක්ටරය සහ ටේලරය |
| 06. | 89264 | අංක EPJV 6821 දරන EDGRO වර්ගයේ අත් ට්‍රැක්ටරය සහ ටේලරය (අමතර කොටස් සඳහා පමණි) |
| 07. | 76618 | අංක රහිත සී පැන් වර්ගයේ අත් ට්‍රැක්ටරය (අමතර කොටස් සඳහා පමණි) |
| 08. | B/6795/18 | අංක EPJL 1322 දරන HERO.HONDA යතුරු පැදිය (අමතර කොටස් සඳහා පමණි) |
| 09. | AR/1249/19 | අංක EPMO 5357 දරන HERO/HONDA ෆැෂන් ප්ලස් වර්ගයේ යතුරු පැදිය (අමතර කොටස් සඳහා පමණි) |
| 10. | AR/10628/17 | HERO/NONDA දරන යතුරු පැදිය (අමතර කොටස් සඳහා පමණි) |
| 11. | AR/10629/17 | අංක EPGI 9570 දරන HONDA CD -90 දරන යතුරු පැදිය (අමතර කොටස් සඳහා පමණි) |

| අනු. අංකය | නඩු අංකය | භාණ්ඩ පිළිබඳ විස්තරය |
|---|---|---|
| 12. | 923 49 | අංක 15-70950 දරන HERO / HONDA SPLENDAR- දරන යතුරු පැදිය (අමතර කොටස් සඳහා පමණි) |
| 13. | 91616 | ලුමාලා වර්ගයේ පාපැදිය |
| 14. | 86026 | මිටාසු වර්ගයේ පාපැදිය |
| 15. | 86026 | හීරෝ වර්ගයේ පාපැදිය |
| 16. | 82356 | ලුමාලා වර්ගයේ පාපැදිය |
| 17. | 75969 | මිටාසු වර්ගයේ පාපැදිය |
| 18. | 69144 | ලුමාලා වර්ගයේ පාපැදිය |
| 19. | 88764 | වර්ගය අපැහැදිලි පාපැදිය |
| 20. | 76062 | ලුමාලා වර්ගයේ පාපැදිය |
| 21. | 76061 | ලුමාලා වර්ගයේ පාපැදිය |
| 22. | 77396 | ලුමාලා වර්ගයේ පාපැදිය |
| 23. | 76228 | ලුමාලා වර්ගයේ පාපැදිය |
| 24. | 76229 | වර්ගය අපැහැදිලි පාපැදිය |
| 25. | 77616 | වර්ගය අපැහැදිලි පාපැදිය |
| 26. | 55207 | වර්ගය අපැහැදිලි පාපැදිය |
| 27. | 46343 | වර්ගය අපැහැදිලි පාපැදිය |
| 28. | AR 6853 | ඩී. එස්. අයි. වර්ගයේ පාපැදිය |
| 29. | AR 10144 | සිංගර් වර්ගයේ පාපැදිය |
| | 93981 | අඩි 5ක් පමණ උස යකඩ අලවංගු 1යි |
| 30. | 90397 | අඩි 4ක් පමණ උස යකඩ අලවංගු 1යි |
| | 90397 | අඩි 1ක් පමණ උස යකඩ අලවංගු 1යි |
| 31. | AR 13251 | තැටි තරාදි 1යි |
| 32. | 96129 | ප්ලාස්ටික් ලොකු බකට් 1යි |
| 33. | 9561 | ප්ලාස්ටික් පොඩි බකට් 1යි |
| 34. | AR 13759<br>AR 13759<br>94063<br>93513 | ප්ලාස්ටික් පොඩි බාල්දි 4යි |
| 35. | 95048<br>94848<br>96473 | කාදු සහිත ලොකු මුට්ටි 3යි |
| 36. | 94039<br>96392<br>90123<br>95048 | කාදු රහිත පොඩි මුට්ටි 4යි |
| 37. | 90264,94301,<br>86650, 95895,<br>95525, 77754,<br>96264, 96816,<br>77579, 94538,<br>96041, 81485,<br>90265, 96131,<br>91616, 94299,<br>89507, 79774,<br>94530, 85308 | කැති 20 යි |
| 38. | 96325, 96548,<br>96440, 95474,<br>95474, 94848,<br>95603, 94008,<br>93952, 90105,<br>92563, 90200,<br>90280, 91996,<br>91142, 93617,<br>93023, 93023,<br>93393, 93619,<br>93542, 93512,<br>93511, 93542,<br>93023, 92968,<br>93742, 96796,<br>96383, 96208,<br>96096, 96796,<br>96380, 96549,<br>96803, 96211,<br>96210, 96209,<br>96552, 96817,<br>96093, 95605,<br>95369, 95372,<br>94382, 93023,<br>93023, 93023,<br>93023, 93023,<br>93023, 94026,<br>94110, 94519,<br>94519, 94827,<br>93023, 90764,<br>96171, 96052,<br>95995, 88427,<br>85593, 82199,<br>93686, 82215,<br>82199, 81926,<br>96441, 54046,<br>82199, 91602,<br>81926, 82215,<br>93857, 83411,<br>91159, 86631,<br>82199, 86631,<br>81926, 96442,<br>91360, 83099,<br>82199, 82056,<br>83099, 81926,<br>93520 | සවල් 90යි |
| 39. | 95024, 95369,<br>94509, 94826,<br>91637, 90026,<br>91825, 90210,<br>90860, 90896, | |

| අනු. අංකය | නඩු අංකය | භාණ්ඩ පිළිබඳ විස්තරය |
|---|---|---|
| | 90120, 91508,<br>96383, 93849,<br>94082, 94644,<br>94115, 94381,<br>94382, 94643,<br>93677, 95051,<br>96171, 96187,<br>95475, 95474,<br>92735, 92734,<br>93616, 93617,<br>92392, 93622,<br>94008, 92563,<br>90625, 90624,<br>90626, 90911,<br>90912, 90347,<br>90408, 90421,<br>90407, 90420,<br>94764, 91718,<br>92760, 92996,<br>92996, 91351,<br>90898, 91353,<br>90897, 91027,<br>90209, 90211,<br>90201, 90924,<br>95372, 57083,<br>93619, 93496,<br>94110, 92992,<br>95486, 95529,<br>95026, 95050,<br>93621, 91638,<br>88118, 80102,<br>80102, 80063,<br>86247, 81538,<br>88116, 78096,<br>83716, 88104,<br>87540, 94756,<br>94115, 82056,<br>83708, 83411,<br>73502, 94115,<br>54526, 82970,<br>81926, 95962,<br>92572, 96817,<br>85593 | පතුල සිදුරු කරන ලද බාල්දි 95යි |
| 40. | 90397, 93982,<br>84685, 87791,<br>94132, 51559,<br>89263, 88951, | උදළු 8යි |
| 41. | 70390, 83419,<br>88492, 93135, | පොරෝව 4යි |
| 42. | 96344, 93918,<br>96583, 96561,<br>93714, 96599, | කල ගෙඩි 07 යි |
| 43. | 96473, 51551, | තාච්චි 02යි |
| 44. | 90397 | ප්ලාස්ටික් තාච්චි 01යි |
| 45. | 94430<br>87864 | අඩක් කපා ඉවත් කරන ලද කල 02යි |
| 46. | 90397 | කුළු ගෙඩි 01යි |
| 47. | 73504<br>88908<br>87526<br>95604<br>90546<br>90767<br>91829<br>81926<br>81926 | පතුල සිදුරු කරන ලද බාල්දි 9යි |
| 48. | නී. වි. ම. විනාශ කිරීමෙන් පසු ඉතිරි වූ භාජන හිස් කැන් 24යි | |
| 49. | නී. වි. ම. විනාශ කිරීමෙන් පසු ඉතිරි වූ හිස් වීදුරු බෝතල්<br>මි. ලි. 750 හිස් බෝතල් 100<br>මි. ලී. 375 හිස් බෝතල් 50<br>මි. ලී. 180 හිස් බෝතල් 75 | |
| 50. | 82807<br>83461<br>83461<br>84544<br>87153<br>93337<br>73784<br>87668<br>75942<br>87153<br>65632<br>87153 | ආරක්ෂිත හිස් වැසුම් 12යි |
| 51. | 67345<br>88789<br>80307<br>93697<br>88608<br>88131<br>92289<br>91685<br>93190<br>78268<br>85720<br>93586<br>96470 | ලොකු බැරල් 13යි |

| අනු. අංකය | නඩු අංකය | භාණ්ඩ පිළිබඳ විස්තරය |
|---|---|---|
| 52. | 93028<br>85118<br>AR 11387<br>80881<br>96070<br>96066<br>91292<br>84715<br>92060<br>95246 | පොඩි බැරල් 10යි |

**අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද 422 චක්‍රලේඛනය ප්‍රකාරව අම්පාර දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ රාජසන්තක කරන ලද වැලි හා බොරළු/පස් වෙන්දේසි කර රජයේ ගිණුමට බැර කිරීම සහ නඩු කටයුතු අවසන් නොවූ විභාග වෙමින් පවතින වැලි වෙන්දේසි කර නඩුවේ ගිණුමට තැන්පත් කිරීමට නියමිත නඩු භාණ්ඩ ලේඛනය**

01. රාජසන්තක කරන ලද වැලි කියුබ් 16

| අනු අංකය | නඩු අංකය | විස්තරය | ප්‍රමාණය |
|---|---|---|---|
| 01. | 80102 | වැලි | කියුබ් 16යි |
| 02. | 81906 | | |
| 03. | 82056 | | |
| 04. | 82970 | | |
| 05. | 83099 | | |
| 06. | 84261 | | |
| 07. | 90973 | | |
| 08. | 95045 | | |
| 09. | 95094 | | |
| 10. | 95102 | | |
| 11. | 95174 | | |
| 12. | 95173 | | |
| 13. | 95219 | | |
| 14. | 95307 | | |
| 15. | 95412 | | |
| 16. | 95446 | | |
| 17. | 95501 | | |
| 18. | 95500 | | |
| 19. | 95562 | | |
| 20. | 96052 | | |
| 21. | 96093 | | |
| 22. | 96096 | | |
| 23. | 96171 | | |
| 24. | 96208 | | |
| 25. | 96325 | | |
| 26. | 96440 | | |
| 27. | 96516 | | |
| 28. | 96803 | | |

02. රාජසන්තක කරන ලද වැලි කියුබ් 48.35

| අනු අංකය | නඩු අංකය | විස්තරය | ප්‍රමාණය |
|---|---|---|---|
| 01. | 96600 | වැලි | කියුබ් 48.35 යි |

03. රාජසන්තක කරන ලද බොරළු /පස් කියුබ් 24

| අනු අංකය | නඩු අංකය | විස්තරය | ප්‍රමාණය |
|---|---|---|---|
| 01. | 91940 | බොරළු පස් | කියුබ් 24යි |
| 02. | 92029 | | |
| 03. | 92026 | | |
| 04. | 92127 | | |
| 05. | 89710 | | |
| 06. | 91158 | | |
| 07. | 91940 | | |
| 08. | 93553 | | |
| 09. | 93576 | | |
| 10. | 93613 | | |
| 11. | 93623 | | |
| 12. | 93766 | | |
| 13. | 93803 | | |
| 14. | 93804 | | |
| 15. | 93805 | | |
| 16. | 94028 | | |
| 17. | 94025 | | |
| 18. | 94024 | | |
| 19. | 94027 | | |

04. රාජසන්තක නොවූ වෙන්දේසි කර නඩුවේ ගිණුමට මුදල් බැර කිරීමට අදාල වැලි කියුබ් 21

| අනු අංකය | නඩු අංකය | විස්තරය | ප්‍රමාණය |
|---|---|---|---|
| 01. | 74504 | වැලි | කියුබ් 21 යි |
| 02. | 77768 | | |
| 03. | 78581 | | |
| 04. | 79484 | | |
| 05. | 79485 | | |
| 06. | 79681 | | |
| 07. | 80706 | | |
| 08. | 94988 | | |
| 09. | 89933 | | |
| 10. | 90633 | | |
| 11. | 91060 | | |
| 12. | 92050 | | |
| 13. | 92766 | | |
| 14. | 95839 | | |
| 15. | 96313 | | |
| 16. | බී 5436 | | |
| 17. | බී 5439 | | |
| 18. | බී 5040 | | |
| 19. | බී 5441 | | |
| 20. | බී 8699/20 | | |
| 21. | 96829 | | |

07-300

## මහනුවර මහෙස්ත්‍රාත් අධිකරණය

ප්‍රසිද්ධ වෙන්දේසි පිළිබඳ නිවේදනය

මහනුවර මහෙස්ත්‍රාත් අධිකරණයේ රාජසන්තක කරන ලද හා අනන්‍යතාවය හඳුනාගත නොහැකි වාහන හා නඩු භාණ්ඩ 2020 ජූලි මස 18 වැනි දින පෙ. ව. 10.00 ට මෙම අධිකරණ පරිශ්‍රයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

01. මෙහි සඳහන් වන කිසියම් වාහනයක් හෝ භාණ්ඩයක් පිළිබඳ හිමිකම් දැක්වීමට අපේක්ෂා කරන තැනැත්තන් වෙන්දේසිය පැවැත්වෙන දින පෙ. ව. 9.30 ට පෙර ස්වකීය හිමිකම් තහවුරු කිරීමට අදාළ සාධක රෙජිස්ට්‍රාර් වෙත ඉදිරිපත්කළ යුතු ය.

02. රෙජිස්ට්‍රාර්ගේ අවසරය මත වෙන්දේසිය පැවැත්වෙන දින පෙ. ව. 8.00 සිට 9.00 දක්වා වෙන්දේසියේ විකිණීමට නියමිත අයිතමයන් පරීක්ෂා කර බැලිය හැකි ය.

03. අධිකරණය විසින් නියම කරනු ලබන අවම ලංසුව නොපිළිගන්නා අවස්ථාවලදී අධිකරණයේ අභිමතය පරිදි එම අයිතමයන් වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ බලය අධිකරණය සතු වේ.

04. වෙන්දේසියෙන් මිළ දී ගන්නා සියලුම භාණ්ඩ සඳහා ගෙවීම් එම අවස්ථාවේ දී ම ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් ගෙවා එදින ප. ව. 3.00 ට පෙර අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු ය. චෙක්පත් භාරගනු නොලැබේ.

05. භාණ්ඩ මිල දී ගන්නා සෑම තැනැත්තෙකු ම ස්වකීය ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කර අනන්‍යතාවය තහවුරු කළ යුතු ය.

දුමින්ද පී. මුදුන්කොටුව,
මහෙස්ත්‍රාත්,
මහනුවර.

2020 ජුනි මස 16 වැනි දින,
මහනුවර මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

### මහෙස්ත්‍රාත් අධිකරණය මහනුවර

වෙන්දේසි කිරීමට නියමිත වාහන හා භාණ්ඩ ලේඛනය

| අනු. අංකය | නඩු අංකය | වාහන අංකය | වාහන වර්ගය | විස්තරය |
|---|---|---|---|---|
| 01. | 53696/12 | 28 ශ්‍රී 5595 | ISUZU වර්ගයේ ලොරි රථය | ලියාපදිංචි කළ නොහැක අමතර කොටස් සඳහා පමණි |
| 02. | 86798/15 | 42-7100 | ISUZU වර්ගයේ ලොරි රථය | ලියාපදිංචි කළ නොහැක අමතර කොටස් සඳහා පමණි |
| 03. | 5978/15 | 40 ශ්‍රී 9362 | ISUZU වර්ගයේ ලොරි රථය | ලියාපදිංචි කළ නොහැක අමතර කොටස් සඳහා පමණි. |
| 04. | 1179/15 | 68-0417 | TOYOTA වර්ගයේ ලොරි රථය | ලියාපදිංචි කළ නොහැක අමතර කොටස් සඳහා පමණි |
| 05. | 16700/10 | 38ශ්‍රී 0386 | MITSUBSHI වර්ගයේ ලොරි රථය | ලියාපදිංචි කළ නොහැක අමතර කොටස් සඳහා පමණි |
| 06. | 92389/14 | CPLD 8175 | YUEJIN වර්ගයේ ලොරි රථය | ලියාපදිංචි කළ හැක |
| 07. | 39417/14 | CPLA 2806 | MAZDA වර්ගයේ ලොරි රථය | ලියාපදිංචි කළ හැක |
| 08. | අංක රහිත | - | - | ඩොල්ෆින් වර්ගයේ වාහන සඳහා යොදා ගන්නා පිටුපස දොරක් |
| 09. | අංක රහිත | - | - | 54 3532 වාහන බඹර් 01 |

07-201

## මහෙස්ත්‍රාත් අධිකරණය - බිබිල

රාජසන්තක කරනු ලැබූ හා හිමිකම් නොපෑ නඩු භාණ්ඩ වෙන්දේසියේ විකිණීම

මෙම අධිකරණ නඩුකරයන්ට අදාළව නඩු භාණ්ඩ ලෙස ඉදිරිපත් කරනු ලැබූ ද්‍රව්‍යයන් අතරින් රාජසන්තක කිරීමට යටත් වූ හිමිකම් නොපෑ පහත සඳහන් ද්‍රව්‍යයන් 2020 ජූලි මස 16 වැනි දින පෙ. ව. 9.00 සිට අධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දන්වනු ලැබේ.

02. මෙහි සඳහන් නඩු භාණ්ඩ අතරින් යමකට හිමිකම් පාන්නෙකු වේනම් වෙන්දේසිය දින වෙන්දේසියට එකී භාණ්ඩ ඉදිරිපත් කිරීමට පෙර ස්වකීය හිමිකම් ඉදිරිපත් කර තහවුරු කළ යුතු ය.

03. වෙන්දේසියට ඉදිරිපත් කර ඇති ද්‍රව්‍ය වෙන්දේසි දින දී වෙන්දේසිය ආරම්භ කිරීමට පැයකට පෙරාතුව අධිකරණ රෙජිස්ට්‍රාර්වරියගේ අවසරය ලබාගෙන පරීක්ෂා කිරීමට කටයුතු කළ හැකි ය.

04. අධිකරණය විසින් නියම කරනු ලබන අවම ලංසුව පිළි නොගෙනෙන අවස්ථාවක දී අභිමතය පරිදි එම භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ අයිතිය අධිකරණය සතුව පවතී.

05. වෙන්දේසියෙන් මිලදී ගනු ලබන භාණ්ඩ සඳහා එකී අවස්ථාවේදී ම මුදල් ගෙවා අධිකරණ භූමියෙන් එදින පස්වරු 4.00 ට පෙර ඉවත් කර ගත යුතු අතර, මුදලින් පමණක් ගෙවීම් කළ යුතු ය.

06. භාණ්ඩ වෙන්දේසියේ දී භාණ්ඩ ඉල්ලුම්කරන්නන් සිය අනන්‍යතාවය තහවුරු කිරීම පිණිස ජාතික හැඳුනුම්පත හෝ වෙනත් අනන්‍යතා සහතික පත්‍රයක් ඉදිරිපත් කිරීමට වග බලා ගත යුතු ය.

බුවනෙක රාජකරුණා,<br>
මහෙස්ත්‍රාත්,<br>
මහෙස්ත්‍රාත් අධිකරණය,<br>
බිබිල.

2020 ජූලි මස 01 වැනි දින,<br>
බිබිල මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

**2020.07.16 දිනට පැවැත්වීමට නියමිත වෙන්දේසියට අදාළ භාණ්ඩ ලැයිස්තුව**

*මහෙස්ත්‍රාත් අධිකරණය - බිබිල*

| *අනු. අංකය* | *නඩු අංකය* | *භාණ්ඩ පිළිබඳ විස්තරය* |
|---|---|---|
| 01. | විවිධ නඩු අංකයන්ට අදාළ | යකඩ බැරල් 10 යි |
| 02. | විවිධ නඩු අංකයන්ට අදාළ | ප්ලාස්ටික් කල 40 යි |
| 03. | විවිධ නඩු අංකයන්ට අදාළ | ලොකු බූලි 50 යි |
| 04. | විවිධ නඩු අංකයන්ට අදාළ | පොඩි කෑන් 60 යි |
| 05. | විවිධ නඩු අංකයන්ට අදාළ | මධ්‍යම ප්‍රමාණයේ කෑන් 50යි |
| 06. | විවිධ නඩු අංකයන්ට අදාළ | ප්ලාස්ටික් බකට් 06යි |
| 07. | විවිධ නඩු අංකයන්ට අදාළ | ප්ලාස්ටික් බැරල් 01 |
| 08. | විවිධ නඩු අංකයන්ට අදාළ | ලොකු වැලි බාල්දි 12 යි |
| 09. | විවිධ නඩු අංකයන්ට අදාළ | පොඩි වැලි බාල්දි 12 යි |
| 10. | විවිධ නඩු අංකයන්ට අදාළ | තංගුස් ලනු තොගයක් |
| 11. | විවිධ නඩු අංකයන්ට අදාළ | සවල් 25 යි |
| 12. | විවිධ නඩු අංකයන්ට අදාළ | කැති 05 යි |
| 13. | විවිධ නඩු අංකයන්ට අදාළ | උදළු 30 යි |
| 14. | විවිධ නඩු අංකයන්ට අදාළ | පොඩි පොරෝ 02 යි |
| 15. | විවිධ නඩු අංකයන්ට අදාළ | ලොකු පොරෝ 02 යි |
| 16. | විවිධ නඩු අංකයන්ට අදාළ | ඉල්ලංකුරු 03 යි |
| 17. | විවිධ නඩු අංකයන්ට අදාළ | අලවංගු 04 යි |
| 18. | විවිධ නඩු අංකයන්ට අදාළ | ගැරුම් වට්ටි 10 යි |
| 19. | විවිධ නඩු අංකයන්ට අදාළ | කැට කුඩ (පොඩි) 05 යි |
| 20. | විවිධ නඩු අංකයන්ට අදාළ | කැට කුඩ (ලොකු) 12 යි |
| 21. | විවිධ නඩු අංකයන්ට අදාළ | පොඩි සින්තා පැදුරු 01යි |
| 22. | විවිධ නඩු අංකයන්ට අදාළ | ඇලුමිනියම් කළ 08යි |
| 23. | විවිධ නඩු අංකයන්ට අදාළ | ඇලුමිනියම් මුට්ටි (පොඩි) 06යි |
| 24. | විවිධ නඩු අංකයන්ට අදාළ | ඇලුමිනියම් මුට්ටි (ලොකු) 04යි |
| 25. | විවිධ නඩු අංකයන්ට අදාළ | ප්ලාස්ටික් බේසම් 01යි |
| 26. | විවිධ නඩු අංකයන්ට අදාළ | ඇලුමිනියම් තාච්චි 02යි |
| 27. | 44865 නඩුවට අදාළව | (ෂෙල්) 05 kg ගෑස් සිලින්ඩර් 01යි, පොඩි ලිප් 02 යකඩ ලිප් 01 යි |
| 28. | 45011 නඩුවට අදාළව | (ෂෙල්) 12.05 kg ගෑස් සිලින්ඩර් 01යි, ලොකු යකඩ ලිප් 01යි |
| 29. | 44912 නඩුවට අදාළව | (ෂෙල්) 12.05 kg ගෑස් සිලින්ඩර් 01යි, ලොකු යකඩ ලිප් 01යි |
| 30. | 44997 නඩුවට අදාළව | (ලාෆ්) 12.05 kg ගෑස් සිලින්ඩර් 01යි |
| 31. | 44768 නඩුවට අදළව | (ෂෙල්) 12.05 kg ගෑස් සිලින්ඩර් 01යි, පොඩි ගෑස් ලිප් 01යි |

07-446

## ගාල්ල මහෙස්ත්‍රාත් අධිකරණය

ගාල්ල මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩු භාණ්ඩ වශයෙන් ඇති රාජසන්තක කරන ලද හා මෙතෙක් හිමිකම් පෑමක් නොකළ පහත සඳහන් භාණ්ඩ 2020.07.26 වැනි ඉරිදා දින පෙ. ව. 9.30 ට අධිකරණ භූමියේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

02. මෙහි පහත සඳහන් කිසියම් භාණ්ඩයක් සඳහා හිමිකම් දක්වන්නෙකු වේ නම් වෙන්දේසිය ආරම්භ කිරීමට පෙර ස්වකීය අයිතිවාසිකම් ඉදිරිපත් කළ යුතු ය.

03. රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය මත එදින වෙන්දේසිය පැවැත්වීමට විනාඩි 30 කට පෙර භාණ්ඩ පරීක්ෂා කළ හැකි ය.

04. අධිකරණය මගින් නියම කරනු ලබන අවම ලන්සුව නොපිළිගැනෙන අවස්ථාවන්හිදී අධිකරණයේ අභිමතය පරිදි ද්‍රව්‍යයන් වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ පූර්ණ අයිතිය අධිකරණය සතුව පවතී.

05. වෙන්දේසියේ දී මිළ දී ගනු ලබන ද්‍රව්‍යයන් සඳහා එවෙලේම මුදල් ගෙවා එකී භාණ්ඩ අධිකරණ භූමියෙන් ඉවත් කරගත යුතු අතර, චෙක්පත් භාරගනු නොලැබේ.

06. භාණ්ඩ ගැනුම්කරුවන් භාණ්ඩ මිලදී ගැනීමේදී ඔවුන්ගේ ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කළ යුතු ය.

07. වෙන්දේසියට පැමිණෙන ගැනුම්කරුවන් රජය විසින් පනවන ලද සෞඛ්‍ය නිර්දේශයට යටත්ව වෙන්දේසි භූමියට පැමිණිය යුතු ය.

කේ. පී. එස්. හර්ෂන්,
මහෙස්ත්‍රාත්/අතිරේක දිසා විනිසුරු,
මහෙස්ත්‍රාත් අධිකරණය,
ගාල්ල.

2020 ජුනි මස 30 වැනි දින,
ගාල්ල මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

### නඩු භාණ්ඩ ලැයිස්තුව

| අනු. අංකය | නඩු අංකය | භාණ්ඩ විස්තරය | ප්‍රමාණය |
|---|---|---|---|
| 01. | 86423 | අංක රහිත අත්ට්‍රැක්ටර් එන්ජිම හා ටේලරය | 01 |
| 02. | 85642 | අංක රහිත අත්ට්‍රැක්ටර් එන්ජිම | 01 |
| 03. | 61347 | අංක රහිත අත්ට්‍රැක්ටර් එන්ජිම හා ටේලරය | 01 |
| 04. | 19700 | අංක රහිත අත්ට්‍රැක්ටර් එන්ජිම | 01 |
| 05. | 86568 | SPPU 9641 ට්‍රක් රථය | 01 |
| 06. | 33825 | ස්කැවේටර් යන්ත්‍ර | 01 |
| 07. | 3357 | WGHZ 5766 ලොරි රථය | 01 |
| 08. | අංක රහිත | අංක රහිත ලොරි රථය | 01 |
| 09. | AR 1326 | 117 - 7571 යතුරු පැදිය | 01 |
| 10. | 86062 | SPBFA 9529 යතුරු පැදිය | 01 |
| 11. | AR 2739 | SPBAT 2350 යතුරු පැදිය | 01 |
| 12. | AR 2091 | අංක රහිත යතුරු පැදිය | 01 |
| 13. | AR 2508 | SPBFO 8292 යතුරුපැදිය | 01 |
| 14. | AR 2090 | SPMJ 9799 යතුරුපැදිය | 01 |
| 15. | AR 2089 | SPGX 2767යතුරු පැදිය | 01 |
| 16. | AR 253/20 | පාපැදි | 01 |
| 17. | AR 256/20 | පාපැදි | 01 |
| 18. | AR 311/20 | පා පැදි | 01 |
| 19. | AR 2976/19 | පා පැදි | 01 |
| 20. | 8587 | DVD ප්ලේයර් | 01 |

| අනු. අංකය | නඩු අංකය | භාණ්ඩ විස්තරය | ප්‍රමාණය |
|---|---|---|---|
| 21. | 6961 | ඇම්ප් | 01 |
| | | බෆල් | 02 |
| 22. | 32929/2004 | මොනිටර් | 02 |
| | | ස්පීකර් | 03 |
| | | කී බෝඩ් | 02 |
| | | ස්කෑන් යන්ත්‍ර | 01 |
| | | ප්‍රින්ටර් | 01 |
| | | ටීවී | 01 |
| 23. | 8321 | ටේබල් ලැම්ප් | 01 |
| | | මල්ටි ප්ලග් | 01 |
| 24. | 60420 | ටයිල් කැට | 01 |
| 25. | 54268 | DVD ප්ලේයර් | 01 |
| | | අයන් | 01 |
| 26. | 67841 | වයර් රෝල් | 01 |
| 27. | AR 2383 | වතුර මෝටර් | 01 |
| 28. | 22575 | ගෑස් සිලින්ඩර් | 02 |
| 29. | 60020 | සවල් | 01 |
| 30. | අංක රහිත | වීදුරු බෝතල් | තොගය |
| 31. | අංක රහිත | ප්ලාස්ටික් කෑන් | තොගය |
| 32. | අංක රහිත | බෝතල් | කේස් |
| 33. | 2526 | ඔරු | 01 |
| 34. | 61241 | ටයිල් කපන මැෂින් | 01 |
| | | ග්‍රිල් මැෂින් | 01 |
| | | ලී ගාන මැෂින් | 01 |
| 35. | AR 514/20 | ජංගම දුරකථන | 01 |
| 36. | AR 512/20 | ජංගම දුරකථන | 01 |
| 37. | AR 513/20 | ටැබ් පරිගණක | 01 |
| | | ජංගම දුරකථන | 01 |
| 38. | AR 468/20 | ජංගම දුරකථන | 01 |
| 39. | 61306 | ජංගම දුරකථන | 01 |
| 40. | 12796 | ජංගම දුරකථන | 02 |
| | | කැමරා | 01 |
| 41. | 63300/ඒ | කැමරා | 02 |
| | | චාජර් | 01 |
| | | ට්‍රාන්ස්ෆෝමර් | 01 |
| | | ජංගම දුරකථන | 01 |
| | | ඕඩියෝ සිස්ටම් යන්ත්‍ර | 01 |
| | | බෆල් | 02 |
| | | ඩී. වී. ඩී. ප්ලේයර් | 01 |
| | | අඟල් 32 රූපවාහිනී යන්ත්‍ර | 01 |
| | | දුරස්ථ පාලකය සහ එහි ඇසුරුම | 01 |
| 42. | අංක රහිත | ජංගම දුරකථන | 01 |
| 43. | අංක රහිත | ජංගම දුරකථන | 01 |
| 44. | AR 931/18 | ජංගම දුරකථනය | 01 |
| 45. | AR 2514 | ජංගම දුරකථන | 01 |
| 46. | AR 1178/19 | ජංගම දුරකථනය | 01 |
| 47. | AR 1047/19 | ජංගම දුරකථන | 01 |
| 48. | AR 1046/19 | ජංගම දුරකථනය | 04 |
| 49. | AR 2963 | කාර් කැසට් | 02 |
| 50. | AR 3221/19 | ජංගම දුරකථන | 01 |
| 51. | 28009 | අලවංගු | 01 |
| | | සවල් | 01 |
| | | උදලු | 01 |
| | | තාච්චි | 01 |
| 52. | 29644 | ගෑස් ලිප් | 01 |
| | | ගෑස් සිලින්ඩර් | 01 |

07-487

# තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම්

## ලුණුගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ රා තැබෑරුම් රේන්ද විකිණීම - 2021 වර්ෂය

2021 වර්ෂයේ ජනවාරි 01 වැනි දින සිට 2021 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා කාලය තුළ පහත සඳහන් උපලේඛනයේ දක්වා ඇති ලුණුගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ රා තැබෑරුම්වල පැසුණු රා සිල්ලරට විකිණීමේ සම්පූර්ණ වරප්‍රසාද මිල දී ගැනීම සඳහා 1982 අගෝස්තු මස 20 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 207 දරන ගැසට් පත්‍රයේ පළකරන ලද රා විකිණීමේ කොන්දේසිවලට ද යටත්ව 2020.08.31 වැනි දින පෙ.ව. 10.30 දක්වා මා විසින් ටෙන්ඩර්පත් කැඳවනු ලැබේ.

02. රා රේන්දය ලබාගැනීමට ඉදිරිපත් වන අය ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් ලබාගත හැකි නියමිත ටෙන්ඩර් ආකෘති පත්‍රයක් නිසියාකාරව සම්පූර්ණ කර මෙහි පහත දක්වා ඇති අනුමත රා තැබෑරුම් ලැයිස්තුවෙන් නියම කර ඇති ටෙන්ඩර් මුදල ගෙවා ලබාගත් වත්කම් සහතිකයක් ද, සහිතව මුද්‍රා තබන ලද කවරයක බහා වම් පස ඉහළ කෙළවරේ තමන් ටෙන්ඩර් කරනු ලබන රා තැබෑරුමේ අංකය හා නම ද පැහැදිලිව ලියා ඒ ඒ තැබෑරුම් සඳහා මෙහි දැක්වෙන ටෙන්ඩර් භාර ගැනීමේ අවසන් වේලාවට පෙර ලියාපදිංචි තැපෑලෙන් එවීමෙන් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ඇති ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කිරීමෙන් ලුණුගල ප්‍රාදේශීය ලේකම්ට ලැබෙන්නට සැළැස්විය යුතු ය.

03. ටෙන්ඩර්කරුවන් විසින් ටෙන්ඩර්පත්‍ර සම්පූර්ණ කිරීමේ දී ටෙන්ඩර් පත්‍රවල කරනු ලබන සෑම වෙනස් කිරීමක් ම ටෙන්ඩර්කරුවන් සම්පූර්ණ අත්සන් යෙදීමෙන් සනාථ කළ යුතු ය. එසේ නොවන ටෙන්ඩර්පත් භාරගනු නොලැබේ.

04. ටෙන්ඩර් භාර ගන්නා අවසාන දිනය වන 2020.08.31 වැනි දින පෙ.ව. 10.30 ට සියලුම ටෙන්ඩර්කරුවන් මෙම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතු ය.

05. කිසියම් කරුණක් සටහන් නොකළ ටෙන්ඩර් පත්‍රිකාවක් හෝ පත්‍රිකා සියල්ලම ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය ලුණුගල ප්‍රාදේශීය ලේකම් සතු ය.

06. පූර්වෝක්ත දින විකිණීමට නොහැකි වූ රා තැබෑරුම් නැවත විකිණීම 2020.10.07 වැනි දින පෙ.ව. 10.30 ට සිදුකරනු ලැබේ. එදින ටෙන්ඩර්පත් ඉදිරිපත් කිරීම මෙමගැසට් නිවේදනයේ සඳහන් අවශ්‍යතාවයන්ට අනුකූල විය යුතු ය.

07. තනි වරප්‍රසාද මිලදීගත් තැනැත්තා යයි ප්‍රකාශයට පත් කිරීමෙන් අනතුරුව එසේ ප්‍රකාශ කළ දින එනම් රේන්ද විකුණූ දින ප.ව. 2.00 ට පෙර ලුණුගල ප්‍රාදේශීය ලේකම් විසින් නියම කරනු ලබන මුදල වන මාස දෙකක මුදල් කොටසට වැඩි කොටසක් ඇප තැන්පත් වශයෙන් මා වෙත ගෙවා තැබෑරුම් පිළිබඳ කොන්දේසිවලට අත්සන් කළ යුතුය.

08. ටෙන්ඩර් ඉදිරිපත් කිරීමේ දී දැනගත යුතු වෙනත් විස්තර ඇත්නම් ඒවා ලුණුගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැකි වේ.

ඩී. එම්. එන්. දිසානායක,
ප්‍රාදේශීය ලේකම්,
ලුණුගල.

2020 ජුනි මස 24 වැනි දින,
ලුණුගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

උපලේඛනය

**2021 වර්ෂය සඳහා අනුමත කරන ලද රා තැබෑරුම් ලැයිස්තුව**

***ලුණුගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය - 2021.01.01 වැනි දින සිට 2021.12.31 වැනි දින දක්වා***

| *අනුක්‍රමික අංකය* | *තැබෑරුමේ නම සහ අංකය* | *කොට්ඨාසය* | *තැබෑරුම් පිහිටුවිය යුතු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *තැබෑරුම විවෘත කළ යුතු වේලාව* | *තැබෑරුම වැසිය යුතු වේලාව* | *ටෙන්ඩර් තැන්පත්* | *ටෙන්ඩර් භාර ගැනීමේ අවසාන දිනය සහ වේලාව* |
|---|---|---|---|---|---|---|---|
| 01 | ලුණුගල අංක 02 | ලුණුගල | ලුණුගල ප්‍රාදේශීය සභාවේ කොට්ඨාස අංක 02 හි වරිපනම් අංක 219 දරන කුරුවි කුඹුරු වත්ත | පෙ.ව. 11.00ට<br>ප.ව. 5.00 | ප.ව. 2.00<br>ප.ව. 8.00 | රුපියල් 5,000 | 2020.08.31 පෙ.ව. 10.30 |

මහදෝව වත්තේ සීමාව තුළ 2021 වර්ෂය සඳහා රා කැන්ටින් බලපත්‍රය අලුත් කිරීමට එම වත්තේ වතු අධිකාරි විසින් ඔහුගේ නිර්දේශය 2020.08.31 වැනි දින හෝ එදිනට ප්‍රථම ලැබෙන සේ ලුණුගල ප්‍රාදේශීය ලේකම් වෙත එවිය යුතු ය.

07-249

---

**කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය**

2021 වර්ෂය සඳහා රා තැබෑරුම් විකිණීම

1982 අගෝස්තු මස 20 වැනි දින අංක 207 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ පළකර ඇති 1983 වර්ෂයට හා ඊට පසු කාල පරිච්ඡේදයන් සඳහා වලංගු රා තැබෑරුම් රේන්ද විකිණීමේ කොන්දේසිවලටත්, එම කාලය තුළ දී පවත්නා සෑම සුරාබදු කොන්දේසියකටමත් යටත්ව, 2021 වර්ෂය තුළ දී පහත සඳහන් උපලේඛනයේ දැක්වෙන රා තැබෑරුම්වල සිල්ලරට රා විකිණීමේ තනි අයිතිය මිල දී ගැනීම සඳහා කොත්මලේ ප්‍රාදේශීය ලේකම් විසින් 2020.08.14 වැනි දින පෙ. ව. 10.30 දක්වා ටෙන්ඩර් භාරගනු ලැබේ.

02. *(අ)* සෑම ටෙන්ඩරයක්ම දිවයිනේ ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් ලබාගත හැකි නියමිත ටෙන්ඩර් පෝරමය විය යුතු ය.

*(ආ)* ටෙන්ඩර් මුදලක් වශයෙන් ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක පහත උපලේඛනයේ දැක්වෙන ආකාර ටෙන්ඩර් මුදලක් තැන්පත් කර නිල කුවිතාන්සියක් සහ,

*(ඇ)* ටෙන්ඩර්කරුගේ ඉඩකඩම් ආදී නිශ්චල දේපළ පිහිටි කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම්ගෙන් ලබාගන්නා ලද වත්කම් පිළිබඳ සහතිකයක් ටෙන්ඩරය සමග ඉදිරිපත් කළ යුතු ය. ටෙන්ඩර් සහ වත්කම් සහතික ඉදිරිපත් කිරීම පිළිබඳ යථොක්ථ රා තැබෑරුම් විකිණීමේ කොන්දේසිවල අඩංගු නියමයන් විධිමත් ලෙස පිළිපැදිය යුතු බව ටෙන්ඩර්කරුවන් වෙත නිවේදනය කෙරේ.

*(ඈ)* ටෙන්ඩර්පත්‍ර සම්පූර්ණ කිරීමේ දී පහත සඳහන් අවශ්‍යතාවයන් කෙරෙහි ද සැලකිලිමත් විය යුතු ය ෑ

*(a)* ටෙන්ඩර්පත්‍ර මුලුමනින් ම සම්පූර්ණ කළ යුතුය. මෙසේ කිරීමේ දී එහි සඳහන් කෙරෙන ගණන ඉලක්කමෙන් පමණක් නොව අකුරෙන් ද ලිවිය යුතු ය.

*(b)* සම්පූර්ණ කරන ලද ටෙන්ඩර්පත්‍රවල නියමිත සාක්ෂිකරුවන්ගේ සාක්ෂිවලට අමතරව පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ හැඳුනුම්පත් අංක ද යෙදිය යුතු ය.

*(c)* සෑම වෙනස් කිරීමක්/කපා හැරීමක් ටෙන්ඩර්කරුගේ සම්පූර්ණ අත්සන සහ දිනය යෙදීමෙන් සහතික කළ යුතු ය.

(d) සෑම ටෙන්ඩර්කරුවෙකුම ටෙන්ඩර් පෝර්මය සමග තම ජාතික හැඳුනුම්පතෙහි සහතික කරන ලද ඡායා පිටපතක් ඉදිරිපත් කළ යුතු ය. මෙම නියමයන්ට පටහැනි ටෙන්ඩර්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

03. විධිමත් ලෙස සම්පූර්ණ කරන ලද ටෙන්ඩර් පත්‍රය ටෙන්ඩර් තැන්පත් මුදල සඳහා ලබා ගන්නා නිල කුවිතාන්සියක් වත්කම් පිළිබඳ සහතිකයත් සමග ලියුම් කවරයක බහා මුද්‍රා තබා කවරයේ වම් පස ඉහළ කෙළවරේ නියමිත තැබෑරුම් අංකය සහ නම'' සඳහන් කර කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ඒ සඳහා තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ ටෙන්ඩර් භාරගැනීම අවසන් වීමට පෙර තැන්පත් කළ යුතු ය. ටෙන්ඩර් පත්‍රය තැපෑලෙන් එවන්නේ නම්, ටෙන්ඩර් භාරගැනීමේ වේලාව ඉකුත්වීමට පෙර ''ප්‍රාදේශීය ලේකම්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, කොත්මලේ යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

04. ටෙන්ඩර් භාරගැනීමේ අවසන් වේලාව පහත උපලේඛනයේ දැක්වේ. එකී වේලාවට ටෙන්ඩර්කරුවන් කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතු ය.

05. ඕනෑම ටෙන්ඩරයක් භාරගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීමේ බලය මා සතුය.

06. තෝරාගත් ටෙන්ඩර්කරු, ගැණුම්කරු ලෙස ප්‍රකාශයට පත් කළ වහාම, එදින ප. ව. 2.00 ට පෙර, ඇප තැන්පත් මුදල වශයෙන් කොත්මලේ ප්‍රාදේශීය ලේකම් විසින් නියම කරනු ලැබිය හැකි වාරික තුනකට නොඅඩු මුදලක් ඇප තැන්පත් වශයෙන් කොත්මලේ ප්‍රාදේශීය ලේකම් වෙත තැන්පත් කළ යුතු ය. එම මුදල මා නමින් පුණ්ඩළුඹය මහජන බැංකුවේ වර්ෂයක ස්ථාවර තැන්පත් ගිණුමක රඳවා තැබීමට රේන්දකරුවන් එකඟ විය යුතු ය. මෙම තැන්පතුව මුදලින් හෝ බැංකුවක් විසින් ගෙවීම සඳහා ද යන්න සඳහන් කරන ලද චෙක්පතකින් හෝ ලංකා බැංකුවෙන් හෝ මහජන බැංකුවෙන් ආරක්ෂිත චෙක්පත් ස්වරූපයෙන් ගෙවිය යුතු ය.

07. අවශ්‍ය මුද්දර ආදිය ඉදිරිපත් කොට කොන්දේසි මාලාවට සහ කොන්ත්‍රාත්තුවට ටෙන්ඩර්කරු අත්සන් තැබිය යුතු ය.

08. පොරොන්දු වන ටෙන්ඩර් මුදල වාරික වශයෙන් මුදලින් පමණක් ගෙවිය හැකි අය ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතු ය.

09. කිසියම් ටෙන්ඩරයක් කිහිප දෙනෙකු විසින් හවුලේ ඉදිරිපත් කරනු ලබන්නේ නම්, ඒ එක් එක් අයවලුන්ගේ පෞද්ගලික ලිපිනයන් වෙන වෙනම පැහැදිලිව දැක්විය යුතු ය.

10. යම් රා තැබෑරුමක් මෙදින විකුණනු නොලැබුවහොත් 2020.09.24 වැනි දින පෙ. ව. 10.30 ට මෙම ස්ථානයේ දී ම විකුණනු ලැබේ.

11. මෙම ටෙන්ඩරය විකිණීම සම්බන්ධයෙන් මාගේ තීරණය අවසාන තීරණය වේ.

12. රේන්ද විකිණීම හා අදාළ කොන්දේසි සහ වෙනත් වැඩි විස්තර කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් විමසා ලබා ගත හැකි ය.

ඕ. එස්. පෙරේරා,
ප්‍රාදේශීය ලේකම්.
කොත්මලේ.

2020 ජුනි මස 12 වැනි දින,
කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

*උපලේඛනය*

| *අංකය හා තැබෑරුමේ නම* | *තැබෑරුම පිහිටි ස්ථානය* | *ටෙන්ඩර් භාරගැනීම අවසන් වේලාව* | *ටෙන්ඩර් තැන්පත් මුදල (රු.)* |
|---|---|---|---|
| *රා තැබෑරුම් :* | | | |
| අංක 1 - කඩදොරපිටිය | කඩදොරපිටිය ග්‍රාමය තුළ | 2020.08.14 පෙ. ව. 10.30 | 5,000 |
| අංක 2 - ඕතලාව | තෝරාගනු ලබන ස්ථානයකට කොත්මලේ ප්‍රාදේශීය ලේකම්ගේ අනුමැතිය ලබාගත් ලිපියක් ඉදිරිපත් කළ යුතු ය | 2020.08.14 පෙ. ව. 10.30 | 5,000 |
| අංක 3- කටුකිතුල | කටුකිතුල ග්‍රාමය තුළ | 2020.08.14 පෙ. ව. 10.30 | 5,000 |

07-312/1

# රජයේ නොවන දැන්වීම්

## ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (2) වගන්තිය ප්‍රකාරව කොළඹ 05, නාරාහේන්පිට, එවර්ග්‍රීන් පාර්ක්, 03 වන පටුමග, අංක 18/51A, සිය ලියාපදිංචි කාර්යාලය පිහිටි, ට්‍රාන්ස් ඒෂියා එක්ස්ප්‍රස් (ප්‍රයිවට්) ලිමිටඩ් (පී වී - 00218070) සමාගමේ නාමය වර්ෂ 2020 ක් වූ ජුනි මස 12 වැනි දින සිට කැන්ටන් ලංකා ලොජිස්ටික්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් යනුවෙන් වෙනස් කොට ඇති බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

අධ්‍යක්ෂක මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

07-204

---

## නිවේදනයයි

වර්ෂ 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම සංස්ථාපිත කළ බවට මෙයින් දන්වමු.

සමාගමේ නම : ෂීවිස් වෙන්චර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 00222182
ලියාපදිංචි කළ දිනය : 2020.05.25
ලියාපදිංචි කාර්යාලයීය ලිපිනය : 40/4, පීටර්ස් පටුමග, දෙහිවල.

සමාගම් ලේකම්වරු.

07-220

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ පහත සඳහන් සමාගම සංස්ථාපිත කළ බැව් මින් දන්වනු ලැබේ.

සමාගමේ නම : ෆෝ ස්ක්වෙයාර් කන්ස්ට්‍රක්ෂන් ඇන්ඩ් ප්‍රොපර්ටි ඩිවලොප්මන්ට් (පී. වී. ටී.) එල්. ටී. ඩී.
ලියාපදිංචි අංකය : පී වී 00223002
ලියාපදිංචි කළ දිනය : 2020.06.16
ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : අංක 22/C/1, ගල්වරුසාලන්ද වත්ත, කොරතොට, කඩුවෙල.

සමාගම් ලේකම්.

07-227

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වන වගන්තිය යටතේ දැන්වීමයි.

සමාගමේ නම : නිව් ඩී. වී. එස්. ඩිස්ට්‍රිබියුටර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි කළ දිනය : 2018.07.19
ලියාපදිංචි අංකය : PV 00202246
ලියාපදිංචි ලිපිනය : නො. 86/1, 1/1, 4 වන පටුමග, උයන පාර, ලුනාව, මොරටුව.

07-232

---

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

ඇමරිකා එක්සත් ජනපදයේ, නිව් ජර්සි, සැඩ්ල් බෲක්, අවුට්වෝටර් ලේන්, අංක 259 දරන ස්ථානයේ පදිංචිව සිට දැනට කුලියාපිටිය තැපැල් දණ්ඩගමුව, මාහිම්පිටිය පාර හි පදිංචි, වර්ණකුලසූරිය විමල් ස්ටයිස්ලාවුස් කිංස්ලි තිසේරු (වි. ග. බ. අංක N 1891651) වන මා විසින් කුලියාපිටිය තැපැල්, දණ්ඩගමුව, මාහිම්පිටිය පාර, ''විමල්පාය'' හි පදිංචි වර්ණකුලසූරිය ලෙස්ලි ක්ලැරන්ස් තිසේරා (ජා. හැ. අංක 721240916 V) වෙත ප්‍රදානය කරන ලද ඇමරිකා එක්සත් ජනපදයේ නිව් ජර්සි හි ලෝරි පියොඩානෝ ප්‍රසිද්ධ නොතාරිස් මහතා විසින් වර්ෂ 2017 ක් වූ ජුලි මස 03 වැනි දින සහතික කරන ලද ඇටෝර්නි බලපත්‍රය මෙයින් ප්‍රත්‍යාදිෂ්ඨ කොට අහෝසි කොට අවලංගු කරන ලද බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ මහජනතාව වෙත මෙයින් දැනුම් දෙනු ලැබේ.

වර්ණකුලසූරිය විමල් ස්ටයිස්ලාවුස් කිංස්ලි තිසේරා.

2020 ජුනි මස 22 වැනි දින දී ය.

07-245

---

## ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි.

සමාගමේ නම : අර්ගි හෝල්ඩිංස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 00221332
ලියාපදිංචි ලිපිනය : අංක 11/7, පළමුවන පටුමග, විජය මාවත, මිනුවන්ගොඩ - 11550

සමාගම් අධ්‍යක්ෂක.

07-246

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වැනි ඡේදයට අනුව පහත සඳහන් සමාගම ලියාපදිංචි කළ බව දන්වමු.

සමාගමේ නම : ඒ. ජේ. සිලෝන් කිං ස්පයිසස් (පීවීටී) එල්ටීඩී
සමාගමේ අංකය : පී වී 00222958
සංස්ථාගත කළ දිනය : 2020.06.15
ලිපිනය : E219/8/2/2, N. H. D. A. ෆලැට්ස්, මොහිදීන් මස්ජිද් පාර, කොළඹ 10.

අධ්‍යක්ෂ මණ්ඩලය.

07-247

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වැනි ඡේදයට අනුව පහත සඳහන් සමාගම ලියාපදිංචි කළ බව දන්වමු.

සමාගමේ නම : එම්. කේ. එල්. හෝල්ඩිංස් (පීවීටී) එල්ටීඩී
සමාගමේ අංකය : පී වී 00217104
සංස්ථාගත කළ දිනය : 2019.10.31
ලිපිනය : 66/10, ශාන්ති පෙදෙස, කෝට්ටගෙවත්ත, උඩුමුල්ල, බත්තරමුල්ල.

අධ්‍යක්ෂ මණ්ඩලය.

07-248

## ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) කොටස යටතේ කරනු ලබන දැන්වීමයි.

නම : ඇන්ඩෘ ඉම්පෙක්ස් ඉන්ටර්නැෂනල් (පීවීටී) එල්ටීඩී
ලියාපදිංචි අංකය : පී වී 114702
ලියාපදිංචි ලිපිනය : 142/4 ඒ, පාදිලියතුඩුව පාර, හුණුපිටිය, වත්තල.

එම්. සී. එම්. නවාස්,
සමාගම් ලේකම්.

07-258

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

අම්බලන්ගොඩ, බෝගහවත්ත, අංක 31 හි පදිංචිව සිට දැනට වැලිකඩ බන්ධනාගාරයේ සිටින හක්කිනි අසංග ද සිල්වා (ජා. හැ. අං. 722163362 V) වන මා විසින් රාජ් හෙට්ටිආරච්චි මහතා විසින් සහතික කරන ලද අංක 308 සහ 2017.12.20 ඇටෝර්නි බලපත්‍රයෙන් අම්බලන්ගොඩ, බෝගහවත්ත, අංක 31 හි පදිංචි දැලත් සුජීවා මනෝරි ද සොයිසා (ජා. හැ. අං. 766862861 V) යන අය මාගේ ඇටෝර්නි බලකාරිය වශයෙන් පත් කළ එම පත්වීම මෙයින් අවලංගු කිරීම.

හක්කිනි අසංග ද සිල්වා.

07-453

## සමාගමක නාමයේ ස්වභාවය වෙනස් කිරීමයි

මාදම්පේ එස්ටේට්ස් ඇන්ඩ් ඉන්වෙස්ට්මන්ට්ස් ලිමිටඩ්
පී බී 448

මාදම්පේ එස්ටේට්ස් ඇන්ඩ් ඉන්වෙස්ට්මන්ට්ස් ලිමිටඩ් සමාගම, තම නාමයේ ස්වභාවය, මාදම්පේ එස්ටේට්ස් ඇන්ඩ් ඉන්වෙස්ට්මන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් යනුවෙන්, 2020 පෙබරවාරි 25 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි, වෙනස් කිරීමට සහා සම්මත කොට ගත් බව, 2007 අංක 07 දරන සමාගම් පනතේ 11 (5) වගන්තිය ප්‍රකාරව දැනුම් දෙනු ලැබේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

පී. ආර්. බිස්නස් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
අධ්‍යක්ෂ.

07-260

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පිළියන්දල සිද්ධමුල්ල අංක 56 හි පදිංචි හැන්නැදි ගමගේ සෝමදාස (ජා. හැ. අ. 521415916 V) හට පිළියන්දල සිද්ධමුල්ල, අංක 56 හි පදිංචි හැන්නදි ගමගේ තාරක රුවන්ජිත් (ජා. හැ. අ. 832820067 V) වන මා විසින් දුන් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් තැන පී. ඩබ්. එස්. සුනිල් වීරසිංහ මහතා විසින් 2013.07.28 වැනි දින සහතික කළ අංක 5454 දරන දෙල්කඳ නුගේගොඩ බස්නාහිර කලාප කාර්යාලය රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ 2013.08.21 වැනි දින 125 කාණ්ඩයේ 59 පත් ඉරුවේ 5099 දින පොතේ සටහන් කරනු ලැබූ විශේෂ ඇටර්නි බලය අවලංගු කර අහෝසි කරන ලදී. මෙදින සිට ඇටෝර්නි බලකරු විසින් ඉහත සඳහන් ඇටෝර්නි බලපත්‍රය යටතේ කරන ලද කිසියම් ක්‍රියාවලට සහ පියවරවලට මා වගකියනු නොලැබේ.

හැන්නදි ගමගේ තාරක රුවන්ජිත්.

07-269

## ඇටෝර්නි බලය ප්‍රත්‍යාදිෂ්ඨ කිරීම

කුරුණෑගල තැපැල්, උයන්දන හිඳගොල්ල 8 වන පියවර අංක 140හි පදිංචි (ජාතික හැඳුනුම්පත් අංක 851533966 V) හිමි කරුණාසිංහලාගේ සුමිත් ප්‍රදීප් ජයතිලක යන මා විසින් කුරුණෑගල තැපැල් දොඩන්ගස්ලන්ද, තෙළඹුගල්ල හි පදිංචි (ජාතික හැඳුනුම්පත්

අංක 772853262 V) හිමි මොහම්මදු මුහුලාර් මොහොම්මඩ් මිෆ්තාහ් යන අය වෙත පවරා දෙන ලද අංක 5771 දරන ප්‍රසිද්ධ නොතාරිස් ෆාතිමා එන්. අන්සාරි මහත්මිය විසින් 2018.11.24 වැනි දින සහතික කරන ලද විශේෂ ඇටෝර්නි බලපත්‍රය මෙයින් අවලංගු කොට ප්‍රත්‍යාදිෂ්ඨ කරන බවත්, මින් ඉදිරියට මොහම්මදු මුහුලාර් මොහොම්මඩ් මිෆ්තාහ් යන අය විසින් එකී විශේෂ ඇටෝර්නි බලපත්‍රය යටතේ මාගේ නාමය හෝ මා වෙනුවෙන් හෝ කරනු ලබන්නා වූ කිසි ගණුදෙණුවකට හෝ කාර්යයකට මාගේ කිසි වගකීමක් නොමැති බවත්, ශ්‍රී ලංකා රජයටත් මහජනතාවටත් මෙයින් දැනුම් දෙමි.

කරුණාසිංහලාගේ සුමිත් ප්‍රදීප් ජයතිලක.

07-272

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වන වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම් සංස්ථාගත කරනු ලැබේ.

නම : මාර්ස් කන්ස්ට්‍රක්ෂන්ස් (පීවීටී) එල්ටීඩී
පීවී අංකය : පී වී 00205071
දිනය : 2018.10.08

ඇක්සන්ට් මැනේජ්මන්ට් (පීවීටී) එල්ටීඩී,

නො. 48/85, සුදුහුම්පොළ පාර,
නුවර.

07-285

---

## විශේෂ ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

පිටකෝට්ටේ, පාගොඩ පාර, ආනන්ද බාලිකා මාවත, 17 වන පටුමග, අංක 53/3 හි පදිංචි ටිරෝන් වැලන්ටයින් ද සිල්වා වික්‍රමසිංහ සහ එම ලිපිනයේ ම පදිංචි බෙනඩික්ටා ප්‍රියන්ති සේපාලිකා වික්‍රමසිංහ විවාහයට පෙර ස්ටීවන් යන අප දෙදෙනාගේ විශේෂ ඇටෝර්නි බලකරු වශයෙන් එම ලිපිනයෙහි ම පදිංචි ශාලිත වැලන්ටයින් ද සිල්වා වික්‍රමසිංහ යන අය පත් කරන ලද, කොළඹ මහාධිකරණ කලාපයේ ප්‍රසිද්ධ නොතාරිස්වරිය වන සුනීතා මෙලනි නානායක්කාර මහත්මිය විසින් වර්ෂ 2018ක් වූ ජනවාරි මස 25 වැනි දින ලියා සහතික කරන ලද අංක 1242 දරන විශේෂ ඇටෝර්නි බලපත්‍රය මෙයින් අවලංගු කළ බව හා එය තවදුරටත් නීතිය ඉදිරියේ බලරහිත වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයට සහ ශ්‍රී ලංකාවාසී මහජනතාවට මෙයින් දන්වා සිටිමි.

ටී. වී. ද සිල්වා වික්‍රමසිංහ,
බී. පී. එස්. වික්‍රමසිංහ වි. පෙ. ස්ටීවන්ස්.

07-286

## ඇටෝර්නි බලය අවලංගු කිරීම

මාතලේ, ගොඩපල පාර, අංක 74 යන ලිපිනයේ පදිංචි මොහොමඩ් උවෙයිස් මොහොමඩ් රෂාඩ් වන මම, නීතිඥ සහ මාතලේ ප්‍රසිද්ධ නොතාරිස් ඒ. එච්. ඩී. මොහිදීන් මහතා ලියා සහතික කළ අංක 802 දරන ඇටෝර්නි බලපත්‍රය මගින් මාතලේ, ගොඩපල පාර, අංක 74 යන ලිපිනයේ පදිංචි මොහොමඩ් නසුර්දීන් නස්රුල් (ජා. හැ. අංක 801142230 V) යන අයට පවරා තිබූ ඇටෝර්නි බලය වර්ෂ 2020.01.16 වැනි දින සිට අවලංගු කරන ලද බව සියලු දෙනාගේ ම දැන ගැනීම පිණිස දන්වා සිටිමි. එකී ඇටෝර්නි බලපත්‍රය මත මින් ඉදිරියට මා වෙනුවෙන් ඔහු විසින් කරන ලද කිසිදු කටයුත්තකට වග නොකියන බව ප්‍රකාශ කරමි.

මොහොමඩ් උවෙයිස් මොහොමඩ් රෂාඩ්.

07-298

---

## ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාරව පහත සමාගම සංස්ථාගත කළ බව මෙයින් දැනුම් දෙමි.

සමාගමේ නම : ගමගෙදර රීඩ් ක්‍රාෆ්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 00220573
ලියාපදිංචි කළ දිනය : 2020.02.21
ලියාපදිංචි කළ ලිපිනය : ගමගෙදර, ගුරුගොඩ, හොරණ.

ලේකම්.

07-348

---

## ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාරව පහත සමාගම සංස්ථාගත කළ බව මෙයින් දැනුම් දෙමි.

සමාගමේ නම : ප්‍රයිම් ඉන්ජිනියරින් ටෙක්නොලොජීස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 00215765
ලියාපදිංචි කළ දිනය : 2019.09.23
ලියාපදිංචි කළ ලිපිනය : නො. 36/1, නුගේගොඩ පාර, පැපිලියාන.

ලේකම්.

07-349

# රට බීම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත්

**2021 වර්ෂය සඳහා කළුතර දිස්ත්‍රික්කයේ හොරණ ප්‍රාදේශීය මහ ලේකම් කොට්ඨාසයේ විදේශ මත්පැන් රේන්දය විකිණීම**

2021 ජනවාරි මස 01 වැනි දින සිට 2021 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා විදේශ මත්පැන් සිල්ලරට විකිණීම සඳහා 1982 අගෝස්තු මස 20 වැනි දින අංක 207 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළ කරන ලද විදේශ මත්පැන් තැබෑරුම් රේන්ද විකිණීමේ කොන්දේසිවලට හා සෑම සුරාබදු බලපත්‍රයකට අදාළ එවකට බලපවත්වන කොන්දේසි මාලාවට යටත්ව පහත උපලේඛනයේ සඳහන් විදේශ මත්පැන් තැබෑරුම පවත්වාගෙන යාම සඳහා සුදුසු ගැණුම්කරුවකු තෝරාගැනීම පිණිස ටෙන්ඩර් භාර ගැනීම හොරණ ප්‍රාදේශීය ලේකම් වන මා විසින් 2020.08.13 වැනි දින පෙ. ව. 10.30 දක්වා සිදු කරනු ලැබේ.

**1. අංක 01 හොරණ විදේශීය මත්පැන් තැබෑරුම -**

02. *(අ)* ටෙන්ඩර් තැන්පත් මුදල වෙනුවෙන් රු. 3,000 ක් ඕනෑම ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයක තැන්පත් කර ලබාගත් කුවිතාන්සියක් සමඟ සෑම ටෙන්ඩරයක් ම ඕනෑම ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයකින් ලබාගත් නියමිත ටෙන්ඩර් ආකෘති පත්‍ර මගින් දෙපිටපතකින් ඉදිරිපත් කළ යුතු ය.

*(ආ)* ටෙන්ඩර්කරුගේ ඉඩකඩම් ආදී නිශ්චල දේපළ පිහිටා ඇති ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම්ගෙන් ලබාගත් ටෙන්ඩර්කරුගේ වත්කම් පිළිබඳ සහතිකයක් ටෙන්ඩර් පත්‍රයට අමුණා තැබිය යුතුය. ටෙන්ඩර් සහ වත්කම් සහතික ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් යථෝක්ත විදේශීය මත්පැන් තැබෑරුම් රේන්ද විකිණීමේ කොන්දේසි මාලාවේ අඩංගුව ඇති නියමයන් විධිමත් ලෙස පිළිපැදිය යුතු බව ටෙන්ඩර් ඉදිරිපත් කරන්නන් වෙත නිවේදනය කෙරේ. ටෙන්ඩර්පත්‍ර සම්පූර්ණ කිරීමේ දී ටෙන්ඩර්කරුවන් පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂයෙන් සැළකිලිමත් විය යුතු ය.

(i) ටෙන්ඩර්පත්‍ර මුළුමනින්ම සම්පූර්ණ කළ යුතු ය. සඳහන් කරන මුදල ඉලක්කමෙන් පමණක් නොව අකුරින් ද ලිවීම කළ යුතු ය.

(ii) සම්පූර්ණ කරන ලද ටෙන්ඩර් පෝරමවල නියමිත පරිදි සාක්ෂිකරුවන්ගේ අත්සන යොදා ඔවුන්ගේ ලිපිනයන් ද සඳහන් කර තිබිය යුතු ය.

(iii) සෑම වෙනස් කිරීමක් හෝ කපා හැරීමක් ටෙන්ඩර්කරුගේ කෙටි අත්සන යොදා සහතික කර තිබිය යුතු ය.

*(ඇ)* මෙම නියමයන්ට පටහැනිව ඉදිරිපත් කරනු ලබන ටෙන්ඩර්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

03. සෑම ටෙන්ඩරයක්ම ටෙන්ඩර්කරුගේ නමින් ඉදිරිපත් කළ යුතු අතර, නියෝජිතයකු විසින් හෝ ලාංකික නොවූ හෝ 1982.08.20 වැනි දින අංක 207 ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළ කරන ලද විදේශීය මත්පැන් රේන්ද විකිණීමේ කොන්දේසි යටතේ නුසුදුසු අයගෙන් ටෙන්ඩර්පත්‍ර භාර ගනු නොලැබේ.

04. විධිමත්ව සකස් කරන ලද ටෙන්ඩර් පත්‍ර කවරයක බහා සීල් තබා කවරයේ වම් කෙළවරේ '' අංක 01 හොරණ විදේශීය මත්පැන් තැබෑරුම් ටෙන්ඩරය 2021'' යනුවෙන් පැහැදිලිව සටහන් කළ යුතු ය. එසේ සකස් කළ ටෙන්ඩර් පත්‍ර සහිත කවර,

*(අ)* හොරණ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කිරීමෙන්, හෝ

*(ආ)* ලියාපදිංචි තැපෑලෙන් එවන්නේ නම් 2020.08.13 වැනි දින පෙ. ව. 10.30 වේලාවට පෙර කාර්යාලයට ලැබෙන සේ "ප්‍රාදේශීය ලේකම්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, හොරණ" යන ලිපිනයට එවිය යුතු ය. ඉහත සඳහන් වේලාවෙන් පසුව තැපෑලේ දී ප්‍රමාද වී කාර්යාලයට ලැබෙන ටෙන්ඩර් පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ටෙන්ඩරය විකුණන දින

නියමිත වේලාවට සියලුම ටෙන්ඩර්කරුවන් හොරණ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයට පැමිණ සිටිය යුතු ය. මෙහි 3 වැනි ඡේදයේ සඳහන් රේන්ද විකිණීමේ කොන්දේසිය යටතේ නුසුදුස්සෙකු නොවන බව ඔප්පු කිරීමට අවශ්‍ය වුවහොත් ඊට අවශ්‍ය ලියකියවිලි ද රැගෙන ආ යුතු ය.

05. සාර්ථක වූ ටෙන්ඩර්කරු විසින් ඔහුගේ ටෙන්ඩරය පිළිගත් බැව් දැන්වූ වහාම රේන්ද විකිණීමේ කොන්දේසිවලට අත්සන් තබා හොරණ ප්‍රාදේශීය ලේකම් විසින් ඇප තැන්පත් මුදල වශයෙන් නියම කරනු ලබන මුදලක් ගෙවිය යුතු ය.

06. 2021 වර්ෂයට දැනට තැබෑරුම පිහිටා ඇති ස්ථානය ලබාදීමට සහතික වනු නොලැබේ. අලුත් ස්ථානයක තැබෑරුම විවෘත කරන්නේ නම් ඒ සම්බන්ධයෙන් හොරණ ප්‍රාදේශීය ලේකම්ගේ අනුමැතිය ලබා ගත යුතු ය.

07. වැඩි විස්තර හොරණ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයෙන් දැනගත හැකි ය.

මෙම දැන්වීම අනුව 2020.08.13 වැනි දින දී මෙම රේන්දය විකිණීමට නොහැකි වුවහොත් පමණක් 2020.09.23 වැනි දින පෙ. ව. 10.30 දක්වා විකිණීම පිණිස ටෙන්ඩර් පත්‍ර භාරගනු ලබන බව ද එසේම නැවත විකිණීම ද 2020.09.23 වැනි දින පෙ.ව. 10.30ට සිදු කරන බව ද වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

කේ. ඩී. එස්. සජීවනා,
ප්‍රාදේශීය ලේකම්,
හොරණ.

2020 ජූනි මස 20 වැනි දින,
හොරණ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

***උපලේඛනය***

***හොරණ අංක 01 දරන විදේශ මත්පැන් රේන්දය විකිණීම -2021***

| *අනු. අංකය* | *කොට්ඨාසයේ නම* | *පළාත් පාලන බල ප්‍රදේශය* | *තැබෑරුම විවෘත කර තබන වේලාවන්* | *තැබෑරුම් රේන්දය විකිණීමට ටෙන්ඩරය භාරගන්නා අවසාන දිනය හා වේලාව* | *ටෙන්ඩර් තැන්පත් මුදල රු.* | *2020.08.13 දින විකිණීමට නොහැකි වුවහොත් නැවත විකිණීමේ දිනය හා වේලාව* |
|---|---|---|---|---|---|---|
| 01. | හොරණ | හොරණ නගර සභා සීමාව | පෙ. ව. 11.00 සිට ප. ව. 2.00 දක්වා ප. ව. 5.00 සිට ප. ව. 8.00 දක්වා | 2020.08.13 දින පෙ. ව. 10.30 | 3,000 | 2020.09.23 දින පෙ. ව. 10.30 ට |

07-205

## නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය

### විදේශ මත්පැන් තැබෑරුම් රේන්ද විකිණීම - 2021 වර්ෂය

1982 අගෝස්තු මස 20 වැනි දිනැති අංක 207 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ පළකර ඇති 1983 වර්ෂයට සහ ඊට පසු කාල පරිච්ඡේදයන් සඳහා වලංගු විදේශ මත්පැන් (ධාන්‍යවලින් මෙරට නිපදවන ලද බීම වර්ග ඇතුළුව) තැබෑරුම් රේන්ද විකිණීමේ කොන්දේසිවලටත්, එම කාලය තුළ දී බලපවත්නා සෑම සුරාබදු කොන්දේසියකටමත් යටත්ව 2021 වර්ෂයේ දී පහත සඳහන් උපලේඛනයේ දැක්වෙන විදේශ මත්පැන් (ධාන්‍යවලින් මෙරට නිපදවන ලද බීම වර්ග ඇතුළුව) සිල්ලරට විකිණීමේ තනි අයිතිය මිල දී ගැනීම සඳහා නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් විසින් 2020.09.18 වැනි දින පෙ. ව. 10.30 දක්වා ටෙන්ඩර් භාර ගනු ලැබේ.

02. *(අ)* සෑම ටෙන්ඩරයක්ම දිවයිනේ ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් ලබා ගත හැකි නියමිත ටෙන්ඩර් පෝර්මයක් මඟින් ඉදිරිපත් කළ යුතු ය;

*(ආ)* ඇප මුදල් වශයෙන් දිවයිනේ ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට පහත උපලේඛනයේ දැක්වෙන ආකාරයට ටෙන්ඩර් මුදල් තැන්පත් කර ලබා ගන්නා නිල කුවිතාන්සිය ඉදිරිපත් කළ යුතු ය.

*(ඇ)* ටෙන්ඩර්කරුගේ ඉඩකඩම් ආදී නිශ්චල දේපළ පිහිටි ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම්ගෙන් ලබා ගන්නා ලද ටෙන්ඩර්කරුගේ වත්කම් පිළිබඳ සහතිකයක් ටෙන්ඩරය සමග ඉදිරිපත් කළ යුතුය. ටෙන්ඩර් සහ වත්කම් සහතික ඉදිරිපත් කිරීම පිළිබඳව යථෝක්ත විදේශීය මත්පැන් තැබෑරුම් විකිණීමේ කොන්දේසිවල අඩංගු නියමයන් විධිමත් ලෙස පිළිපැදිය යුතුය.

*(ඇ)* ටෙන්ඩර් පත්‍රය සම්පූර්ණ කිරීමේ දී පහත සඳහන් අවශ්‍යතාවයන් කෙරෙහි ද සැළකිලිමත් විය යුතු ය :-

(1) ටෙන්ඩර් පත්‍රය මුළුමනින්ම සම්පූර්ණ කළ යුතු ය. එසේ කිරීමේදී එහි සඳහන් කරන ගණන් ඉලක්කමෙන් පමණක් නොව අකුරෙන් ද ලිවිය යුතුය;

(2) සම්පූර්ණ කරන ලද ටෙන්ඩර් පත්‍රවල නියමිත සාක්ෂිකරුවන්ගේ අත්සන්වලට අමතරව, ජාතික හැඳුනුම්පත් අංකයද යෙදිය යුතුය;

(3) සෑම වෙනස් කිරීමක්ම/කපා හැරීමක්ම ටෙන්ඩර්කරුගේ සම්පූර්ණ අත්සන හා දිනය යෙදීමෙන් සහතික කළ යුතු ය;

(4) සෑම සාර්ථක ටෙන්ඩර්කරුවෙක්ම ටෙන්ඩර් පෝර්ම සමග තමන්ගේ සහතික කරන ලද ජාතික හැඳුනුම්පතෙහි ඡායා පිටපතක් ඉදිරිපත් කළ යුතුය.

මෙම නියමයන්ට පටහැනි ටෙන්ඩර් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

03. විධිමත් ලෙස සම්පූර්ණ කරන ලද ටෙන්ඩර් පත්‍රය ටෙන්ඩර් තැන්පත් මුදල සඳහා ලබා ගන්නා ලද නිල කුවිතාන්සිය සහ වත්කම් පිළිබඳ සහතිකය සමග ලියුම් කවරයක බහා සීල් තබා කවරයේ වම් කෙළවර මුදුනේ නියමිත තැබෑරුම් අංකය හා නම් සඳහන් කර නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ඒ සඳහා තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ ටෙන්ඩර් භාර ගැනීම අවසන්වීමට පෙර තැන්පත් කළ යුතුය. ටෙන්ඩර්පත් තැපෑලෙන් එවන්නේ නම් ටෙන්ඩර් භාර ගැනීමේ වේලාව ඉකුත්වීමට පෙර නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

04. ටෙන්ඩර් භාර ගැනීමේ අවසන් වේලාව පහත සඳහන් උපලේඛනයේ දැක්වේ. එකී වේලාවට ටෙන්ඩර්කරුවන් නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතුය.

05. ඕනෑම ටෙන්ඩරයක් භාර ගැනීමේ හෝ ප්‍රතික්ෂේප කිරීමේ බලය මා සතුය.

06. තෝරාගත් ටෙන්ඩර්කරු ගැණුම්කරු ලෙස ප්‍රකාශයට පත් කළ වහාම එදින ප.ව. 2.00 ට පෙර ඇප තැන්පත් මුදල වශයෙන් නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් විසින් නියම කරනු ලබන මුදල නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් වෙත තැන්පත් කළ යුතුය. මෙම මුදල නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් නමින් නුවරඑළිය ලංකා බැංකුවේ වාර්ෂික ස්ථිර තැන්පත් ගිණුමක රඳවා තැබීමට රේන්දකරුවන් එකඟ විය යුතු ය. මෙම තැන්පතුව මුදලින් හෝ බැංකුව විසින් ගෙවීම සඳහා යන්න සටහන් කරන ලද චෙක්පතකින් ලංකා බැංකුවෙන් හෝ මහජන බැංකුවෙන් ආරක්ෂිත චෙක්පත් ස්වරූපයෙන් ගෙවිය යුතුය. අවශ්‍ය මුද්දර ආදිය ඉදිරිපත් කොට කොන්දේසි මාලාවට සහ කොන්ත්‍රාත්තුවකට ටෙන්ඩර්කරු අත්සන් තැබිය යුතුය.

07. පොරොන්දු වන ටෙන්ඩර් මුදල වාරික වශයෙන් මුදලින් පමණක් ගෙවිය හැකි අය ටෙන්ඩර්පත් ඉදිරිපත් කළ යුතුය.

08. කිසියම් ටෙන්ඩරයක් කීප දෙනෙකු හවුලේ ඉදිරිපත් කරනු ලබන්නේ නම් ඒ එක් එක් අයවලුන්ගේ පෞද්ගලික ලිපිනයන් වෙන වෙනම පැහැදිලිව දැක්විය යුතුයි.

09. යම් තැබෑරුමක් මෙදින විකුණනු නොලැබුවහොත් 2020.11.04 වැනි දින පෙ.ව. 10.30 ට මෙම ස්ථානයේ දී නැවත විකුණනු ලැබේ.

10. මෙම රේන්ද විකිණීම සම්බන්ධයෙන් මගේ තීරණය අවසාන තීරණය වේ.

11. රේන්ද විකිණීමට අදාළ කොන්දේසි සහ වෙනත් වැඩි විස්තර සඳහා නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් විමසීම් කළ හැකිය.

ඒ. ඒ. විදුර සම්පත්,
ප්‍රාදේශීය ලේකම්,
නුවරඑළිය.

2020 ජුනි 22 වැනි දින,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
නුවරඑළිය.

***උපලේඛනය***

***විදේශ මත්පැන් තැබෑරුම්***

| *අංකය හා තැබෑරුමේ නම* | *තැබෑරුම පිහිටුවිය යුතු ස්ථානය* | *ටෙන්ඩර් භාර ගන්නා දිනය* | *ටෙන්ඩර් භාර ගන්නා අවසාන වේලාව* | *ටෙන්ඩර් තැන්පත් මුදල* |
|---|---|---|---|---|
| අංක 01- නුවරඑළිය | නුවරඑළිය මහ නගර සභා අංක 06 කොට්ඨාසය තුළ | 2020.09.18 | පෙ.ව. 10.30 | රු. 5,000 |

07-310

---

**කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය**

2021 වර්ෂය සඳහා විදේශ මත්පැන් තැබෑරුම් විකිණීම

1982 අගෝස්තු මස 20 වැනි දින අංක 207 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළකර ඇති 1983 වර්ෂයට හා ඊට පසු කාල පරිච්ඡේදයන් සඳහා වලංගු විදේශීය මත්පැන් (ධාන්‍යවලින් මෙරට නිපදවන බීම වර්ග ඇතුළුව) තැබෑරුම් රේන්ද විකිණීමේ කොන්දේසිවලටත්, එම කාලය තුළ දී බලපවත්නා සෑම සුරාබදු කොන්දේසියකටමත් යටත්ව, 2021 වර්ෂය තුළ දී පහත දක්වෙන උපලේඛනයේ දැක්වෙන විදේශ මත්පැන් (ධාන්‍යවලින් මෙරට නිපදවන බීම වර්ග ඇතුලුව) සිල්ලරට විකිණීමේ තනි අයිතිය මිල දී ගැනීම සඳහා කොත්මලේ ප්‍රාදේශීය ලේකම් විසින් 2020.08.17 වැනි දින පෙ. ව. 10.30 දක්වා ටෙන්ඩර් භාරගනු ලැබේ.

02. *(අ)* සෑම ටෙන්ඩරයක් ම දිවයිනේ ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් ලබාගත හැකි නියමිත ටෙන්ඩර් පෝරමයක් විය යුතු ය.

*(ආ)* ටෙන්ඩර් මුදලක් වශයෙන් ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක පහත උපලේඛනයේ දැක්වෙන ආකාර ටෙන්ඩර් මුදලක් තැන්පත් කර නිල කුවිතාන්සියක් ; සහ

*(ඇ)* ටෙන්ඩර්කරුගේ ඉඩකඩම් ආදී නිශ්චල දේපළ පිහිටි කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම්ගෙන් ලබාගන්නා ලද වත්කම් පිළිබඳ සහතිකයක් ටෙන්ඩරය සමග ඉදිරිපත් කළ යුතු ය. ටෙන්ඩර් සහ වත්කම් සහතික ඉදිරිපත් කිරීම පිළිබඳව යථෝක්ත විදේශීය මත්පැන් තැබෑරුම් විකිණීමේ කොන්දේසිවල අඩංගු නියමයන් විධිමත් ලෙස පිළිපැදිය යුතු බව ටෙන්ඩර්කරුවන් වෙත නිවේදනය කෙරේ.

*(ඇ)* ටෙන්ඩර්පත්‍ර සම්පූර්ණ කිරීමේ දී පහත සඳහන් අවශ්‍යතාවයන් කෙරෙහි ද සැළකිලිමත් විය යුතු ය ඃ

*(a)* ටෙන්ඩර්පත්‍ර මුලුමනින් ම සම්පූර්ණ කළ යුතු ය. මෙසේ කිරීමේ දී එහි සඳහන් කෙරෙන ගණන ඉලක්කමෙන් පමණක් නොව අකුරෙන් ද ලිවිය යුතු ය.

*(b)* සම්පූර්ණ කරන ලද ටෙන්ඩර්පත්‍රවල නියමිත සාක්ෂිකරුවන්ගේ සාක්ෂිවලට අමතරව පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ හැඳුනුම්පත් අංක ද යෙදිය යුතු ය.

*(c)* සෑම වෙනස් කිරීමක්/කපා හැරීමක් ටෙන්ඩර්කරුගේ සම්පූර්ණ අත්සන සහ දිනය යෙදීමෙන් සහතික කළ යුතු ය.

*(d)* සෑම ටෙන්ඩර්කරුවෙකුම ටෙන්ඩර් පෝරමය සමඟ තමන්ගේ ජාතික හැඳුනුම්පතෙහි සහතික කරන ලද ඡායා පිටපතක් ඉදිරිපත් කළ යුතු ය. මෙම නියමයන්ට පටහැනි ටෙන්ඩර්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

03. විධිමත් ලෙස සම්පූර්ණ කරන ලද ටෙන්ඩර් පත්‍රය ටෙන්ඩර් තැන්පත් මුදල සඳහා ලබා ගන්නා නිල කුවිතාන්සිය සහ වත්කම් පිළිබඳ සහතිකය සමඟ ලියුම් කවරයක බහා මුද්‍රා තබා කවරයේ වම් පස ඉහළ කෙළවරේ ''නියමිත තැබෑරුම් අංකය සහ නම'' සඳහන් කර කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ඒ සඳහා තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ ටෙන්ඩර් භාරගැනීම අවසන් වීමට පෙර තැන්පත් කළ යුතු ය. ටෙන්ඩර් පත්‍රය තැපෑලෙන් එවන්නේ නම්, ටෙන්ඩර් භාරගැනීමේ වේලාව ඉකුත් වීමට පෙර ''ප්‍රාදේශීය ලේකම්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, කොත්මලේ''යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

04. ටෙන්ඩර් භාර ගැනීමේ අවසන් වේලාව පහත උපලේඛනයේ දැක්වේ. එකී වේලාවට ටෙන්ඩර්කරුවන් කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතු ය.

05. ඕනෑම ටෙන්ඩරයක් භාරගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීමේ බලය මා සතුය.

06. තෝරාගත් ටෙන්ඩර්කරු, ගැණුම්කරු ලෙස ප්‍රකාශයට පත් කළ වහාම, එදින ප. ව. 2.00 ට පෙර, ඇප තැන්පත් මුදල වශයෙන් කොත්මලේ ප්‍රාදේශීය ලේකම් විසින් නියම කරනු ලැබිය හැකි වාරික තුනකට නොඅඩු මුදලක් ඇප තැන්පත් වශයෙන් කොත්මලේ ප්‍රාදේශීය ලේකම් වෙත තැන්පත් කළ යුතු ය. එම මුදල මා නමින් පුණ්ඩළුඔය මහජන බැංකුවේ වාර්ෂික ස්ථාවර තැන්පත් ගිණුමක රඳවා තැබීමට රේන්දකරුවන් එකඟ විය යුතු ය. මෙම තැන්පතුව මුදලින් හෝ බැංකුව විසින් ගෙවීම සඳහා ද යන්න සඳහන් කරන ලද චෙක් පතකින් හෝ ලංකා බැංකුවෙන් හෝ මහජන බැංකුවෙන් ආරක්ෂිත චෙක්පත් ස්වරූපයෙන් ගෙවිය යුතු ය.

07. අවශ්‍ය මුද්දර ආදිය ඉදිරිපත් කොට කොන්දේසි මාලාවට සහ කොන්ත්‍රාත්තුවකට ටෙන්ඩර්කරු අත්සන් තැබිය යුතු ය.

08. පොරොන්දු වන ටෙන්ඩර් මුදල වාරික වශයෙන් මුදලින් පමණක් ගෙවිය හැකි අය ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතු ය.

09. කිසියම් ටෙන්ඩරයක් කිහිප දෙනෙකු විසින් හවුලේ ඉදිරිපත් කරනු ලබන්නේ නම්, ඒ එක් එක් අයවලුන්ගේ පෞද්ගලික ලිපිනයන් වෙන වෙනම පැහැදිලිව දැක්විය යුතු ය.

10. යම් තැබෑරුමක් මෙදින විකුණනු නොලැබුවහොත් 2020.09.25 වැනි දින පෙ. ව. 10.30 ට මෙම ස්ථානයේ දී ම නැවත විකුණනු ලැබේ.

11. මෙම ටෙන්ඩරය විකිණීම සම්බන්ධයෙන් මාගේ තීරණය අවසාන තීරණය වේ.

12. රේන්ද විකිණීම හා අදාළ කොන්දේසි සහ වෙනත් වැඩි විස්තර කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් විමසා ලබා ගත හැකි ය.

ඕ. එස්. පෙරේරා,
ප්‍රාදේශීය ලේකම්,
කොත්මලේ.

2020 ජුනි මස 12 වැනි දින,
කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

උපලේඛනය

| අංකය හා තැබෑරුමේ නම | තැබෑරුම පිහිටි ස්ථානය | ටෙන්ඩර් භාරගැනීම අවසන් වේලාව | ටෙන්ඩර් තැන්පත් මුදල (රු.) |
|---|---|---|---|
| විදේශ මත්පැන් තැබෑරුම : අංක 2 - පුණ්ඩළුඔය | පුණ්ඩළුඔය නගරය පහළ කඩ වීදිය | 2020.08.17 පෙ. ව. 10.30 | 5,000 |

07-312/2

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

**සම්පත් බැංකුව පීඑල්සී**
**(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනය

සෙනුරි ඔටෝ ට්‍රේඩර්ස්.
ගිණුම් අංක : 0030 1000 3899.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදනය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2019.10.31 දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් පන් කෝටි හැත්තෑ හය ලක්ෂ දෙදහස් විස්සයි ශත හතලිස් පහක (රු. 57,602,020.45) මුදල ද, 2019 ඔක්තෝබර් මස 09 වැනි දින සිට ගම්පහ අංක 2531364 දරන හිමිකම් සහතික පත්‍රයේ 2017 ජූලි 15, 2016 නොවැම්බර් මස 24 සහ 2018 මැයි මස 21 දාතම දරන එකී බැඳුම්කර සහ අංක 3578 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුළුමුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් පන්කෝටි හතලිස් නම ලක්ෂයක (රු. 54,900,000.00) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහසයයි දශම පහක් (16.5%) බැගින් වූ පොළිය ද, දැන්වීම් ගාස්තුද, ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදු වූ ගාස්තු ද, වෙනත් තදනන්තරව දරන්නට සිදු වූ යම් මුදලක් වෙතොත් ඒවා අඩු කොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ සහ පරිශ්‍රයන් 2019.12.13 වැනි දින රජයේ ගැසට් පත්‍රයේ 2019.12.02 වැනි දින ''දිවයින'' සහ ''තිනකුරල්'' සහ ''අයිලන්ඩ්'' දිනපතා ප්‍රවෘත්ති පත්‍රවල පළකොට ඇති පරිදි 2020.08.13 වැනි දින පෙ.ව. 11.00 ට කැඩැස්තර එස් 510127 සහ ප. ව. 1.30 ට ලොට් 1 පිඹුර 5396 පිහිටි ස්ථානයේ දී කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන පී. කේ. ඊ. සේනාපති යන අය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**උපලේඛනය**

1. බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, දිවුලපිටිය ප්‍රාදේශීය සභා සීමාවන් තුළ සහ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසයේ, අකරන්ගහ, අංක 56B දරන ග්‍රාම නිළධාරි කොට්ඨාසය තුළ, අකරන්ගහ පිහිටි ඉඩමට සර්වේයර් ජෙනරාල් විසින් සත්‍යාපනය කරන ලද කැඩස්තර් සිතියම් අංක 510127 හි බ්ලොක්, අංක 03හි නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන්කොට ඉඩම් කැබලි 0060 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : ඉඩම් කැබලි 54 (පාර - ප්‍රාදේශීය සභා), නැගෙනහිරට : මෙහි ඉඩම් කැබලි 208, දකුණට : මෙහි ඉඩම් කැබලි 207 සහ බස්නාහිරට : මෙහි ඉඩම් කැබලි 205 (පාර), මෙහි ලොට් 206 සහ 61 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් අක්කර එකයි රූඩ් එකයි පර්චස් දෙකයි දශම පහක් (A:1, R:1, P:2.5) හෝ හෙක්ටයාර බිංදුවයි දශම පහයි එකයි දෙකයි එකක් (0.5121 Ha) විශාල ඉඩම් කොටස පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමඟ එකී කැඩැස්තර් සිතියම් අංක 510127 සහ ගම්පහ හිමිකම් සහතිකපත් අංක 2531364ට අනුව ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

එකී කැඩස්තර් සිතියම් අංක 510127 ඉඩම් කැබලි 205 දිගේ හා ඒ මතින් ගමන් කිරීමේ හා මාර්ග අයිතිය ද සමඟ ය.

(ගම්පහ අංක 2531364 දරන හිමිකම් සහතිකපත්‍රයේ 2017 ජූලි 15, 2016 නොවැම්බර් මස 24 සහ 2018 මැයි මස 21 දාතම දරන උකස් බැඳුම්කර මගින් හා ඒ යටතේ උකස්කොට ඇප කොට ඇත.)

2. වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, දකුණු පිටිගල් කෝරළේ, කම්මල් පත්තුවේ, වෙන්නප්පුව ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසය සහ ප්‍රාදේශීය සභා සීමාවන් තුළ, උල්හිටියාව - උතුර ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ උල්හිටියාව ග්‍රාමයේ පිහිටි " තල්ගහවත්ත නොහොත් මෙපෙල්ස්" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ඩබ්ලිව්. එස්. එස්. ඒ. ප්‍රනාන්දු යන අය

විසින් සාදන ලද 2016 අප්‍රේල් මස 05 දාතම හා අංක 5396 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන්කොට ලොට් 1 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : ඩී. පිටර්ස් විසින් හිමිකම් කියනු ලබන ඉඩම, නැගෙනහිරට : ඩී. පිටර්ස් විසින් හිමිකම් කියනු ලබන ඉඩම්, දකුණට : පාර (ප්‍රාදේශීය සභා) - මෙප්ලස් පාර සහ බස්නාහිරට : උපාලි දාබරේරා විසින් හිමිකම් කියනු ලබන ඉඩම යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් තිහක් (A:0, R:0, P:30) විශාල ඉඩම් කොටස පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක 5396 දරන පිඹුරට අනුවය.

එකී අංක 5396 දරන පිඹුරේ නිරූපිත ලොට් 1 පහතින් විස්තර කොට ඇති ඉඩමේ නැවත මිනුමකි.

එකී උල්හිටියාව ග්‍රාමයේ පිහිටි "තල්ගහවත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන වයි. එම්. ආර්. යාපා යන අය විසින් සාදන ලද 2002 ඔක්තෝබර් මස 05 දාතම හා අංක 8316 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන්කොට ලොට් 1 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : මෙම ඉඩමේ ඉතිරි කොටස, නැගෙනහිරට : බලයලත් මානක තැන ටී. සී. එස්. ප්‍රනාන්දු යන අය විසින් සාදන ලද අංක 188/71 දරන පිඹුරේ ලොට් 3A, දකුණට : මෙප්ලස් පාර සහ බස්නාහිරට : උපාලි දාබරේරා විසින් හිමිකම් කියනු ලබන ඉඩම යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් තිහක් (A:0, R:0, P:30) විශාල ඉඩම් කොටස පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක 8316 දරන පිඹුරට අනුව වෙළුම/පත්‍රිරුව G 173/113 යටතේ මාරවිල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

(උකස් බැඳුම්කර අංක 3578 මගින් හා ඒ යටතේ උකස්කොට ඇප කොට ඇත.)

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

07-358

---

**සම්පත් බැංකුව පීඑල්සී**

(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනය

මිඩාස් කන්ස්ට්‍රක්ෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ගිණුම් අංක : 0030 1000 4291.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2019.10.31 දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් දෙකෝටි හතලිස් හත් ලක්ෂ තිස් නම දහස් නමසිය අසූ තුනයි ශත දෙකක (රු. 24,739,983.02) මුදල ද, 2019 සැප්තැම්බර් මස 26 වැනි දින සිට අංක 3596 සහ 3598 දරන උකස් බැඳුම්කර මත අයවිය යුතු මුළුමුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් දෙකෝටි තිස් එක් ලක්ෂ අසූ පන් දහසක (රු. 23,185,000.00) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහසයක් (16%) බැගින් වූ පොලිය ද, දැන්වීම් ගාස්තුද, ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදු වූ ගාස්තු ද, වෙනත් තදනන්තරව දරන්නට සිදු වූ යම් මුදලක් වේනොත් ඒවා අඩු කොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ සහ පරිශ්‍රයන් 2019.12.13 වැනි දින රජයේ ගැසට් පත්‍රයේ 2019.12.03 වැනි දින ''දිවයින'' සහ ''තිනකුරල්'' සහ ''අයිලන්ඩ්'' දිනපතා ප්‍රවෘත්ති පත්‍රවල පළකොට ඇති පරිදි 2020.07.31 වැනි දින පෙ.ව. 11.00 ට ලොට් 1 පිඹුර 184 9 සහ ප. ව. 12.00 ලොට් 2 බී පිඹුර 2117/සී පිහිටි ස්ථානයේ දී කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන පී. කේ. ඊ. සේනාපති යන අය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**උපලේඛනය**

වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, දකුණු පිටිගල් කෝරළේ, කම්මල් පත්තුවේ, වෙන්නප්පුව ප්‍රාදේශීය සභා සීමාවන් තුළ සහ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසයේ, අංගම්පිටිය බටහිර ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ අංගම්පිටිය ග්‍රාමයේ පිහිටි "අඹගහවත්ත, නාරංගහඹිවිට, බෙලිගහපල්ලම සහ නිතුගහඹිවිට" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ඩබ්ලිව්. එස්. එස්. ඒ. ප්‍රනාන්දු යන අය විසින් සාදන ලද මෙම පිඹුරේ 2018 මැයි 27 දාතම සහිතව උපබෙදුම් කරන ලද 2007 දෙසැම්බර් මස 24 දාතම හා අංක $2117^{C}$ දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන්කොට ලොට් 2B වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : මෙහි ලොට් 2A (අඩි 12 පළල පාර) සහ නලින් පෙරේරා විසින් හිමිකම් කියනු ලබන ඉඩම, නැගෙනහිරට : කලින් ස්ටාර් පෙරේරා විසින් හිමිකම් කියනු ලැබූ බලයලත් මානක තැන ඩබ්ලිව්. එල්. එච්. ප්‍රනාන්දු යන අය විසින් සාදන ලද අංක 8459 දරන පිඹුරේ නිරූපිත ලොට් 1, මෙහි ලොට් 2 සහ බලයලත් මානක තැන වයි. එම්. ආර්. යාපා යන අය විසින් සාදන ලද අංක 10861 දරන පිඹුරේ නිරූපිත ලොට් 16, දකුණට : සුසිලා මාලනී නෝනිස් විසින් හිමිකම් කියනු ලබන ඉඩම සහ මෙහි ලොට් 1 සහ බස්නාහිරට : මෙහි ලොට් 1 සහ මෙහි ලොට් 2A (අඩි 12 පළල පාර) යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් තිස් අටයි දශම හයක් (A:0, R:1, P:38.6) විශාල ඉඩම් කොටස පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමඟ එකී අංක $2117^{C}$ දරන පිඹුරට අනුව වෙළුම/පත්‍රිරුව G 231/101 යටතේ මාරවිල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

ඉහත සඳහන් පරිදි අංක $2117^{C}$ නිරූපිත එකී ලොට් 2A හි (පාර - අඩි 12 පළල) උතුරු මායිම් වශයෙන් නිරූපිත පාර සහ ලොට්

2A (පාර - අඩි 12 පළල) යන දෙකම මතින් යටින් දහ දිගේ ගමන් කිරීමේ අයිතීන්ද සමග ය.

(උකස් බැඳුම්කර අංක 3596 මගින් හා ඒ යටතේ උකස්කොට ඇප කොට ඇත.)

2. වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, දකුණු පිටිගල් කෝරළේ, ඕතර පළාත, වෙන්නප්පුව ප්‍රාදේශීය සභා සීමාවන් තුළ සහ දංකොටුව ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසයේ, පහළ දුම්මලකොටුව ග්‍රාම නිලධාරී කොට්ඨාසය තුළ, දුම්මලකොටුව පිහිටි "කෝන්ගහවත්ත කහටගහවත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ඩබ්ලිව්. එස්. එස්. ඒ. ප්‍රනාන්දු යන අය විසින් සාදන ලද 2006 ඔක්තෝබර් මස 24 දාතම හා අංක 1849 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන්කොට ලොට් 1 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : බලයලත් මානක තැන එන්. ඩී. ජී. සී. ගුණසේකර යන අය විසින් සාදන ලද අංක 2272/1 දරන පිඹුරේ නිරූපිත ලොට් 11 (අඩි 15 පළල පාර), නැගෙනහිරට : එකී අංක 2272/1 දරන පිඹුරේ නිරූපිත ලොට් 10 (අඩි 10 පළල පාර) සහ අංක 2272/1 දරන එකී පිඹුරේ නිරූපිත ලොට් 8, දකුණට : ශියාණි විසින් හිමිකම් කියනු ලබන ඉඩම සහ බස්නාහිරට : ලැනී විසින් හිමිකම් කියනු ලබන ඉඩම යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් විස්සක් (A:0, R:0, P:20) විශාල ඉඩම් කොටස පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක 1849 දරන පිඹුරට අනුව වෙළුම/පත්‍ඉරුව E 196/122 (වෙනත් විස්තර තීරුව) යටතේ මාරවිල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අංක 1849 දරන පිඹුරේ නිරූපිත එකී ලොට් 1 පහතින් විස්තර කොට ඇති ඉඩමේ නැවත මිනුමකි :

එකී දුම්මලකොටුව පිහිටි "කෝන්ගහවත්ත කහටගහවත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන එන්. ඩී. ජී. සී. ගුණසේකර යන අය විසින් සාදන ලද 2001 සැප්තැම්බර් මස 15 දාතම හා අංක 2272/1 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන්කොට ලොට් 9 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : මෙහි ලොට් 11 (පාර), නැගෙනහිරට : මෙහි ලොට් 10 (පාර) සහ මෙහි ලොට් 8, දකුණට : ශියාණි විසින් හිමිකම් කියනු ලබන ඉඩම සහ බස්නාහිරට : ලැනී විසින් හිමිකම් කියනු ලබන ඉඩම යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් විස්සක් (A:0, R:0, P:20) විශාල ඉඩම් කොටස පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක 2272/1 දරන පිඹුරට අනුව වෙළුම/පත්‍ඉරුව E 196/122 යටතේ මාරවිල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

එකී අංක 2272/1 දරන නිරූපිත ලොට් 10 (පාර අඩි 10 පළල) සහ ලොට් 11 (පාර අඩි 15 පළල) යන දෙකම මතින් යටින් දිගේ ගමන් කිරීමේ හා මාර්ග අයිතිය ද සමඟ ය.

(උකස් බැඳුම්කර අංක 3598 මගින් හා ඒ යටතේ උකස් කොට ඇප කොට ඇත.)

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

07-359/1

**සම්පත් බැංකුව පීඑල්සී**
**(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනය

ඩබ්ලිව්. එන්. අයි. එස්. යූ. ප්‍රනාන්දු.
ගිණුම් අංක : 1030 5493 8438.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදනය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2019.10.31 දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් එක්කෝටි දොළොස් ලක්ෂ අනූ එක් දහස් නමසිය පනස් දෙකයි ශත දොළහක (රු. 11,291,952.12) මුදල ද, 2019 සැප්තැම්බර් මස 26 වැනි දින සිට අංක 3638, 3636 සහ 3001 දරන උකස් බැඳුම්කර මත අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් එක්කෝටි තුන් ලක්ෂයක (රු. 10,300,000.00) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහසයක් (16%) හා තවත් රුපියල් තුන් ලක්ෂයක (රු. 300,000.00) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහ හතරයි දශම පහක් (14.5%) බැගින් වූ පොළිය ද, දැන්වීම් ගාස්තුද, ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදු වූ ගාස්තු ද, වෙනත් තදනන්තරව දරන්නට සිදු වූ යම් මුදලක් වෙතොත් ඒවා අඩු කොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ සහ පරිශ්‍රයන් 2019.12.13 වැනි දින රජයේ ගැසට් පත්‍රයේ 2019.12.03 වැනි දින ''දිවයින'' සහ ''තිනකුරල්'' සහ ''අයිලන්ඩ්'' දිනපතා ප්‍රවෘත්ති පත්‍රවල පළකොට ඇති පරිදි 2020.07.31 වැනි දින පෙ.ව. 10.00 ට ලොට් 3 පිඹුර 6613 C, පෙ. ව. 10.30 ට ලොට් 1 පිඹුර 4903 සහ ප. ව. 1.00 ට ලොට් 2/1 පිඹුර 4587/26 C පිහිටි ස්ථානයේ දී කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන පී. කේ. ඊ. සේනාපති යන අය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**උපලේඛනය**

1. වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, දකුණු පිටිගල් කෝරළේ, කම්මල් පත්තුවේ, වෙන්නප්පුව ප්‍රාදේශීය සභා සීමාවන් තුළ සහ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසයේ, අන්ගම්පිටිය බටහිර ග්‍රාම නිලධාරී කොට්ඨාසය තුළ, අන්ගම්පිටිය ග්‍රාමයේ පිහිටි මීගමුව පාර දකුණ, වරිපනම් අංක 264A දරන "කණයන්කුලිය" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන එම්. ජී. එස්. සමරතුංග යන අය විසින් සාදන ලද 2011 ජුනි මස 27 දාතම හා අංක 6613C දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන්කොට ලොට් 3 වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : මෙහි ලොට් 1 සහ 2, නැගෙනහිරට : හලාවත සිට කොළඹ දක්වා පාර (ප්‍රධාන), දකුණට : මෙහි ලොට් 4 සහ බස්නාහිරට : පාර යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් තිස් හතරයි දශම එකයි බිංදුවක් (A:0, R:0, P:34.10) විශාල ඉඩම් කොටස පස, ගහකොළ,

වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමඟ එකී අංක 6613C දරන පිඹුරට අනුව ය.

**අංක 6613 C දරන පිඹුරේ නිරූපිත එකී ලොට් 3 පහතින් විස්තර කොට ඇති ඉඩමේ නැවත මිනුමකි:**

එකී අන්ගම්පිටිය ග්‍රාමයේ පිහිටි "කණයන්කුලිය" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන එම්. ජී. එස්. සමරතුංග යන අය විසින් සාදන ලද 1997 ජනවාරි මස 07 දාතම හා අංක 3287 B දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන්කොට ලොට් 2 වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : මෙහි ලොට් 1, නැගෙනහිරට : හලාවත සිට කොළඹ දක්වා පාර (ප්‍රධාන), දකුණට : මෙහි ලොට් 1 නමුත් වඩා නිවැරදිව මෙහි ලොට් 3 සහ බස්නාහිරට : දෙවට පාර යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් තිස් හතරයි දශම අටයි බිංදුවක් (A:0, R:0, P:34.80) විශාල ඉඩම් කොටස පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමඟ එකී අංක 3287B දරන පිඹුරට අනුව වෙළුම/පත්ඉරුව G 67/127 යටතේ මාරවිල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

**අංක 6613 C දරන පිඹුරේ නිරූපිත එකී ලොට් 3 හි බටහිර මායිමේ නිරූපිත පාර දිගේ හා ඒ මතින් ඒ යටින් ගමන් කිරීමේ හා මාර්ග අයිතිය ද සමඟ ය.**

(උකස් බැඳුම්කර අංක 3638 මගින් හා ඒ යටතේ උකස් කොට ඇප කොට ඇත.)

2. වයඹ පළාතේ, පුත්තලම් දිස්ත්‍රික්කයේ, දකුණු පිටිගල් කෝරළේ, කම්මල් පත්තුවේ, වෙන්නප්පුව ප්‍රාදේශීය සභා සීමාවන් තුළ සහ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසයේ, අන්ගම්පිටිය බටහිර ග්‍රාම නිළධාරි කොට්ඨාසය තුළ අන්ගම්පිටිය ග්‍රාමයේ පිහිටි "කණයන්කුලිය" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන යූ. එස්. කේ. එදිරිසිංහ යන අය විසින් සාදන ලද 2016 ජූනි මස 23 දාතම හා අංක 4903 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන්කොට ලොට් 1 වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : පාර (ප්‍රාදේශීය සභා), නැගෙනහිරට : බලයලත් මානක තැන එම්. ජී. එස්. සමරතුංග යන අය විසින් සාදන ලද අංක 3287 දරන පිඹුරේ නිරූපිත ලොට් 1 හි කොටසක්, දකුණට : අංක 3287 දරන පිඹුරේ නිරූපිත ලොට් 2 හි කොටසක් සහ බස්නාහිරට : පාර යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දොළහක් (A:0, R:0, P:12) විශාල ඉඩම් කොටස පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමඟ එකී අංක 4903 දරන පිඹුරට අනුවය.

අංක 4903 දරන පිඹුරේ නිරූපිත එකී ලොට් 1 පහතින් විස්තර කොට ඇති ඉඩමේ නැවත මිනුමකි :

එකී අන්ගම්පිටිය ග්‍රාමයේ පිහිට "කණයන්කුලිය" යයි කියනු ලබන ඉඩමට සීමා නිර්ණය කොට බෙදාවෙන්කොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : ගම්සභා පාර, නැගෙනහිරට : මුළු ඉඩමෙන් වෙන් කෙරෙන ලද උතුරු කොටස, දකුණට : මෙහි ලොට් 2 සහ බස්නාහිරට : දෙවට පාර යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දොළහයි දශම අටයි බිංදුවක් (A:0, R:0, P:12.80) විශාල ඉඩම් කොටස පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමඟ වෙළුම/පත්ඉරුව G 98/68 යටතේ මාරවිල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

එකී අංක 4903 දරන පිඹුරේ නිරූපිත එකී ලොට් 1 හි බටහිර මායිමේ නිරූපිත පාර දිගේ හා ඒ මතින් ඒ යටින් ගමන් කිරීමේ හා මාර්ග අයිතිය ද සමඟ ය.

(උකස් බැඳුම්කර අංක 3636 මගින් හා ඒ යටතේ උකස් කොට ඇප කොට ඇත.)

3. වයඹ පළාතේ, පුත්තලම් දිස්ත්‍රික්කයේ, දකුණු පිටිගල් කෝරළේ, කම්මල් පත්තුවේ, වෙන්නප්පුව ප්‍රාදේශීය සභා සීමාවන් තුළ සහ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසයේ, අන්ගම්පිටිය බටහිර අංක 484 B දරන ග්‍රාම නිළධාරි කොට්ඨාසය තුළ අන්ගම්පිටිය ග්‍රාමයේ පිහිටි "තෙළෙඹුගහවත්ත සහ කොහොඹගහවතුපංගුව" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ජේ. එම්. එෆ්. එස්. වීරසිංහ යන අය විසින් සාදන ලද 2015 අගෝස්තු මස 05 දාතම හා අංක 4587/2 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන්කොට ලොට් 2/1 වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : පාර (ප්‍රාදේශීය සභා), නැගෙනහිරට : මෙහි ලොට් 2/2, දකුණට : ඒ. සී. රොෂාන් ප්‍රනාන්දු විසින් හිමිකම් කියනු ලබන ඉඩම සහ බස්නාහිරට : බලයලත් මානක තැන ජේ. එම්. එෆ්. එස්. වීරසිංහ යන අය විසින් සාදන ලද අංක 4587 දරන පිඹුරේ නිරූපිත ලොට් 1 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් විසි හතරක් (A:0, R:0, P:24) විශාල ඉඩම් කොටස පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමඟ එකී අංක 4587/2 දරන පිඹුරට අනුව වෙළුම/පත්ඉරුව G 219/103 යටතේ මාරවිල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

(උකස් බැඳුම්කර අංක 3001 මගින් හා ඒ යටතේ උකස් කොට ඇප කොට ඇත.)

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

07-359/2

**සම්පත් බැංකුව පීඑල්සී**
**(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනය

ඒ. ඩබ්ලිව්. ඊ. අයි. කේ. අබේරුවන්.
ගිණුම් අංක : 0085 5000 8115.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදනය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2019.02.28 දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් පනස් හත් ලක්ෂ හැත්තෑ පන් දහස් අනූ හතරයි ශත දහයක (රු. 5,775,094.10) මුදල ද, 2019 ජනවාරි මස 24 වැනි දින අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් පනස් හය ලක්ෂ පන් දහස් හත්සිය හැටයි ශත හැට හතක (රු.5,605,760.67) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහ තුනයි දශම පහක් (13.5%) බැගින් වූ පොළිය ද, දැන්වීම් ගාස්තු ද, ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදු වූ ගාස්තු ද, වෙනත් තදනන්තරව දරන්නට සිදු වූ යම් මුදලක් වෙතොත් ඒවා අඩු කොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ සහ පරිශ්‍රයන් 2019.05.10 වැනි දින රජයේ ගැසට් පත්‍රයේ 2019.05.02 වැනි දින ''දිවයින'' සහ ''තිනකුරල්'' සහ ''අයිලන්ඩ්'' දිනපතා ප්‍රවෘත්ති පත්‍රවල පළකොට ඇති පරිදි 2020.08.14 වැනි දින පෙ.ව. 11.00 ට පිහිටි ස්ථානයේ දී මහනුවර බලයලත් වෙන්දේසිකරුවන් වන අයි. ඩබ්ලිව්. ජයසූරිය යන අය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**උපලේඛනය**

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ නැගෙනහිර කෝරළේ, පැලිස්පත්තුවේ මැදදුම්බර ප්‍රාදේශීය සභා සීමාවන් තුළ සහ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසය තුළ සියඹලාගස්තැන්න ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුල රඹුක්වැල්ල පිහිටි "පහුරුකන්ද වත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන එස්. එම්. පී. සමරකෝන් යන අය විසින් සාදන ලද 2015 නොවැම්බර් මස 03 වැනි දින හා අංක 764 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන්කොට ලොට් 1 වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : අංක 181/02/2005 දරන පිඹුරේ ලොට් 1, නැගෙනහිරට : මහනුවර සිට මහියංගනය දක්වා පාර, දකුණට : බලයලත් මානක තැන ඩබ්ලිව්. ඒ. පියදාස යන අය විසින් සාදන ලද අංක 181/02/2005 දරන පිඹුරේ ලොට් 4 සහ බස්නාහිරට : අංක 181/02/2005 දරන පිඹුරේ ලොට් 3 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දහයයි දශම තුනක් (A.0, R.0, P. 10.3) විශාල ඉඩම් කොටස පස, ගහකොළ, වගාවන් ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක 764 දරන පිඹුරට අනුව ය.

එකී අංක 181/02/2005 දරන පිඹුරේ ලොට් 2 හි නැවත මිනුමක් වන එකී ලොට් 1 පහතින් මැනවින් විස්තර කොට ඇත.

එකී රඹුක්වැල්ල පිහිටි "පහුරුකන්ද වත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ඩබ්ලිව්. ඒ. පියදාස යන අය විසින් සාදන ලද 2005 ජනවාරි මස 31 වැනි දින හා අංක 181/02/2005 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන්කොට ලොට් 2 වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : මෙහි ලොට් 1, නැගෙනහිරට : මහනුවර සිට මහියංගනය දක්වා පාර, දකුණට : මෙහි ලොට් 4 සහ බස්නාහිරට : මෙහි ලොට් 3 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දහයයි දශම තුනක් (A.0, R.0, P. 10.3) විශාල ඉඩම් කොටස පස, ගහකොළ, වගාවන් ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක 181/02/2005 දරන පිඹුරට අනුව වෙළුම/පත්‍රිරුව S 203/63 යටතේ මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්,

07-360